# ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම

## වාර්ෂික වාර්තාව - 2007


ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
96,කිරුළ පාර
කොළඹ 05,
ශ්‍රී ලංකාව.

දුරකථන ඵ :00 94 11* 53 53 635 ත 53 33 002 ත 53 33 006ත
ෆැක්ස් **: (00 94 11) 53 35 500**
විද්‍යුත් තැපෑල **: info@pccsl.lk**
වෙබ් අඩවිය **: www.pccsl.lk**

## අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිතුමාගේ පණිවුඩය

මෙරට මුද්‍රිත මාධ්‍ය සහ පොදු ජනතාව අතර ගැටලු සමථකරණය, මැදිහත්කරණය හෝ බේරුම්කරණය සඳහා කටයුතු කරන මණ්ඩලයක් වන ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සිව්වැනි වසර සම්පූර්ණ කරයි.

මෙම ස්වේච්ඡා ස්වයං නියාමන කොමිසම වසර 25කට අධික කාලයක් මෙරට ක්‍රියාත්මක වූ පුවත්පත් මණ්ඩලයට විකල්පයක් ලෙස පිහිටුවනු ලැබුවකි. රජය මගින් නම් කරන ලද පුද්ගලයින් ගෙන් සමන්විත පුවත්පත් මණ්ඩලය මගින් බොහෝ විට පුවත්පත්වලට එරෙහිව විනිශ්චයන් ලබා දුන් බව ඔබට මතක ඇතයි සිතමි. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම අද පුවත්පත් කර්මාන්තය සහ මහජනතාව වෙනුවෙන් අර්බුද විසඳීමේ මණ්ඩලයක් ලෙස කටයුතු කරන ආයතනයකි. පිළිගත් සිවිල් පරිපාලන නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් එයට පුවත්පත් නියෝජනය කරන පස්දෙනෙක් සහ සිවිල් සමාජය නියෝජනය කරන පස්දෙනෙක් වශයෙන් ඇතුළත් වෙති. එමගින් ඕනෑම පුරවැසියෙකු විසින් ඉදිරිපත් කරන පැමිණිල්ලක් සලකා බැලීමට කටයුතු කරයි. ජාතික පුවත්පත් කතුවරුන් විසින්ම සකසන ලද වෘත්තීය ප්‍රතිපත්ති මාලාවේ රීති උල්ලංඝනය වීම් පිළිබඳව මෙහිදී සොයා බැලෙන අතර මෙමගින් නිදහස්, සාධාරණ සහ කඩිනම් විසඳුම් ලබා දෙයි.

පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් පොදු ජනතාවට අවශ්‍ය සහාය ලබාදීම උදෙසා ලේකම් කාර්යාලයක් ද පිහිටුවා ඇත. ජාතික පුවත්පත් මඟින් පළකරන ඇතැම් ලිපිවලට අදාළ ගැටලුකාරී කරුණු පිළිබඳව අදාළ පුවත්පත් කතුවරයා සම්බන්ධ කරගැනීමට හෝ ඒ පිළිබඳව පැමිණිලි කිරීමට මෙම ලේකම් කාර්යාලය සහාය වෙයි.

මෙය අප රට තුළ වගකීම් සහිත ජනමාධ්‍යයක් බිහිකිරීම උදෙසා පුවත්පත් කර්මාන්තයේ දායකවීමකි. කර්තෘවරුන් ගේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව, ජනමාධ්‍යවේදීන්ට ඉහළ ප්‍රමිතියක් සහිතව කටයුතු කිරීමේ වෘත්තියමය පදනම ලෙස සැලකිය හැකිය. මේ අනුව, ඔවුන් සෑමවිටම සිය වගකීම් ඉටුකරනු ඇති බව රටේ සහ පොදු ජනතාවගේ අපේක්ෂාව වේ.

ස්වේච්ඡා, ස්වයං - නියාමන යාන්ත්‍රණයක් වන බැවින්, කොමිසමේ රීති හා ක්‍රියාවලිය අනුගමනය කිරීමට හෝ එහි සහභාගීකරුවන් වන ලෙස කිසිදු පුවත්පතක් වෙත බල කිරීමට ඊට හැකියාවක් නොමැත. එසේ වුව ද බහුතරයක් පුවත්පත් ආයතන එහි සහභාගීත්ව සාමාජිකයන් වීම සතුටුදායක කරුණකි. මෙම සත්කාර්යය උදෙසා ඔවුන්ගේ පූර්ණ සහාය ලැබෙන බවද පැවසිය යුතුය. එබැවින් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ක්‍රියාකාරීත්වය පිළිබඳව තවත් බොහෝ රටවල මෙන්ම විශේෂයෙන් කලාපීය රටවල අවධානය යොමුව ඇත.

කෙසේ වුව ද මෙම ව්‍යායාමය ආරම්භයේදී අප අපේක්ෂා කළ තත්ත්වයට කොමිසමේ ක්‍රියාකාරීත්වය මෙතෙක් වර්ධනය වී නොමැත. අපගේ පණිවුඩය වඩා පුළුල් පරාසයක පතුරාලිය යුතුය. කොමිසම ආරම්භයේදී ලද දිරිගන්වන සුළු ප්‍රතිචාරය පසුගිය මාස කිහිපය තුළදී අඩුවී තිබේ. මේ නිසා ඊට වඩා පුළුල් මහජන සහභාගීත්වයක් ඇති කිරීම කඩිනම් අවශ්‍යතාවකි. මෙම ව්‍යාපාරය උදෙසා මහත් වූ පිළිගැනීමක් ඇතිකරගත හැකි වන්නේ ඒ තුළිනි.

මෙරට තුළ නව මාධ්‍ය සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා කොමිසම මගින් ආරම්භ කරන ලද ක්‍රියාමාර්ග නව සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ඉදිරියට ගෙන යනු ඇති බව මගේ විශ්වාසයයි. යහපත් වගකීමකින් යුත් ජනමාධ්‍යවේදයක් ප්‍රවර්ධනය කිරීම උදෙසා වන අපගේ උත්සාහයට පූර්ණ සහාය ලබා දෙන ලෙස සියලුම පුවත්පත් ප්‍රකාශයන්ගෙන්, කතුවරුන්ගෙන් සහ ජනමාධ්‍යවේදීන්ගෙන් මම ඉතා ඕනෑකමින් යුතුව ඉල්ලා සිටිමි.

කර්මාන්තය තුළ අප හා එක්වූ සැමට ස්තූතිවන්ත වන අතර අනෙකුත් අය විසින් ද අපගේ ව්‍යායාමය පුවත්පත් ප්‍රකාශකයන්, කතුවරුන් සහ ජනමාධ්‍යවේදීන්ට දඬුවම් පැමිණවීමේ බලය සහිත වූ පුවත්පත් මණ්ඩලයට සාපේක්ෂව අවම විරුද්ධවාදියෙකු ලෙස සලකනු ඇතැයි අපි විශ්වාස කරමු.

සිය වටිනා කාලය කැපකරමින් අපට ස්වේච්ඡාවෙන් සහාය දැක්වූ ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සභාපතිවරයාට සහ එහි සාමාජිකයන්ට ස්තුතිය පළ කිරීම සඳහා මෙය අවස්ථාවක් කර ගනිමි. කොමිසමට ආධාර උපකාර කළ, ඊට සහාය දැක් වූ සැමට ද තුති පුදමි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත මුළු හදවතින්ම සහාය දැක් වූ කොමිසමේ ලේකම් කාර්යාලයට, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයට සහ ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලයට ද මම ස්තුතිය පළ කරමි.

(ආර්.එස්.විජේවර්ධන)

# ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සභාපතිතුමාගේ පණිවුඩය 2007

පැමිණිලි විසඳීම සහ හානිකර දෑ කෙරෙහි පරීක්ෂාකාරී වෙමින් පොදු උනන්දුව දනවන ලිපි පළකිරීමට කර්තෘවරු සංවේදී කරගැනීම සම්බන්ධයෙන් වූ කඩිනම් සහ කාර්යක්ෂමතාවය පැත්තෙන් ගත්කල ශ්‍රීලංකා පුවත්පත් පැමිණිලි කොමිසම දියුණුවක් ලබා ඇති බව පෙනෙන්නට තිබේ.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් අනුගමනය කරනු ලබන වෘත්තීය ප්‍රතිපත්ති මාලාව සංශෝධනය කිරීමේ වගකීම ඇති ශ්‍රී ලංකා කර්තෘ සංසදය, එම ප්‍රතිපත්ති මාලාව සංශෝධනය කිරීමේ සහ අවශ්‍ය වෙනස්කම් කිරීමේ කටයුතු දැනටමත් අරම්භ කරතිබේ. මෙම අත්‍යාවශ්‍ය කාර්යය අවසන් කිරීම සඳහා එක්ව කටයුතු කිරීම සියලුම කර්තෘවරුන් ගේ යුතුකමකි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත අඩු පැමිණිලි සංඛ්‍යාවක් ලැබෙන්නේ එක් අතකින් සාමාන්‍ය ජනතාව තුළ පුවත්පත් පැමිණිලි කොමිසමේ ක්‍රියාවලිය පිළිබඳව පවතින අවබෝධය අඩු නිසා බවටත්, තවත් අතකින් පුවත්පත්, වෘත්තීය ප්‍රතිපතිති මාලාව උල්ලංඝනය කිරීමෙන් වැළකීසිටින නිසා බවටත් අදහස්කළ හැකිය. මෙම ප්‍රත්‍යක්ෂය පරිපූර්ණ වශයෙන් නිවැරදිවීකක් නොවන්නේ පුවත්පත් පැමිණිලි කොමිසම මුද්‍රිත මාධ්‍යයේ ප්‍රශ්න විසඳ දීමට උපකාර කරනු පිණිස පවතින ආයතනයක් බවට වූ පණිවුඩය පොදු ජනතාව වෙත ගෙනයාමට එම ආයතනය මහත් සේ උත්සාහ කර ඇති බැවිනි.

පුවත්පත් සම්බන්ධයෙන් ගත්කල වෘත්තීය ප්‍රතිපත්ති මාලාව උල්ලංඝනය නොකිරීමටත්, නුසුදුසු ඡායාරූප පළකිරීම, ජාතිකත්වය සඳහන් කරමින් චෝදනා එල්ල කිරීම වැනි දේ නැවැත්වීම සඳහාත් කර්තෘවරුන් තම පුවත්පත් නිෂ්පාදනයන් පිළිබඳව තියුණු සුපරීක්ෂාවක් ඇති කර ගැනීම අත්‍යාවශ්‍යවේ.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සිය පස්වන වසරට පිවිසෙන මෙම අවස්ථාවේ දී ආරවුල් නිරාකරණ මණ්ඩලය වෙනුවෙන් පුවත්පත් පැමිණිලි කොමිසමේ සියලු කටයුතු සාර්ථකවේවායි සුබපැතීමට කැමැත්තෙමි.

සෑම් විජේසිංහ
සභාපති

# වාර්ෂික විමසුම

**හැඳින්වීම**

ශ්‍රී ලංකා පුවත්පත් සමාජය, ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය යන සංවිධාන ත්‍රිත්වය සමග ශ්‍රී ලංකා වෘත්තීය පුවත්පත්කලාවේදීන් ගේ සංගමය, ලෝක පුවත්පත් සංවිධානය, පොදු රාජ්‍ය මණ්ඩලීය පුවත්පත් සංගමය, අන්තර්ජාතික පුවත්පත් ආයතනය, ආටිකල් 19 සංවිධානය සහ දකුණු අප්‍රිකානු මාධ්‍ය ආයතනය ආදියේ ද සහයෝගය ඇතිව 1998 වසරේදී කොළඹ දී මුළුදෙන ලද අන්තර්ජාතික සම්මේලනයෙන් පසුව නිකුත් කළ 'පුවත්පත් නිදහස සහ සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශනයේ' ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම බිහිවුණි. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම යනු ශ්‍රී ලංකා පුවත්පත් සමාජය,ශ්‍රී ලංකා කර්තෘ සංසදය,සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය යන සංවිධානවලින් සමන්විතවන ශ්‍රී ලංකාවේ පුවත්පත් කර්මාන්තය විසින් පිහිටුවනු ලැබූ ස්වයං නියාමන යාන්ත්‍රණයකි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම කටයුතු කිරීමේ දී 1995 අංක 11 දරන බේරුම්කරණ පනත යටතේ සමථකරණය, මැදිහත්කරණය සහ / හෝ බේරුම්කරණ මූලධර්ම පදනම් කරගනිමින් කටයුතු කරයි. එය මහා බ්‍රිතාන්‍ය පුවත්පත් පැමිණිලි කොමිසම මෙන්ම ස්වීඩන් සහ දකුණු අප්‍රිකානු රටවල ක්‍රියාත්මකවන ආකාරයේ ආකෘතියකට අනුකූලව සකස් වූවකි. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ තීන්දු ප්‍රසිද්ධ කිරීමට කිසියම් පුවත්පතක් කටයුතු නොකරන්නේ නම්, සහ එවැනි අවස්ථාවකදී පැමිණිලිකරු එය අවසානයක් දක්වා ගෙනයාමට බලාපොරොත්තු වන්නේ නම්, අධිකරණමය ක්‍රියාමාර්ග ගත හැකිය. එමෙන්ම එම තීන්දුව කොළඹ මහාධිකරණයේ බලාත්මක කළ හැකිය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම 2007 දී සිව්වන වසරට පා තැබුවේය.තව දුරටත් ජය ගත යුතු අභියෝග රැසක් තිබියදී නමුත් සැලකිය යුතු ප්‍රගතියක් ද අත්පත් කරගෙන තිබේ.එම අභියෝග අතර කැපී පෙනෙන්නේ පුවත්පත්වලින් සමහර කොටසකගේ සහභාගීත්වය තබා ගැනීමය. විශේෂයෙන් සන්ඩේ ලීඩර්, සන්ඩේ ඔබ්සර්වර්, මෝනිං ලීඩර් සහ ඉරුදින යන පුවත්පත් ඒ අතර වේ. පුවත්පත් කර්මාන්තය විසින් ප්‍රවෘත්ති බෙදාහැරීමෙහිලා ස්ථාපිත කිරීමට පරිශ්‍රම දරන ස්වයං නියාමන යාන්ත්‍රණයට මේ පුවත්පත් දායකත්වයක් ලබා දී නැත. කෙසේ නමුත් ලේක්හවුස් සමූහයට අයත් ඩේලිනිව්ස් දිනමිණ, තිනකරන් යන පුවත්පත් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ක්‍රියාවලියට පූර්ණ සහයෝගය දක්වන බව සතුටින් සඳහන් කළ හැකි ය.

ශ්‍රී ලංකාවේ පුවත්පත් වසර 150 කට අධික කාලයක් තිස්සේ මුද්‍රණය කෙරෙතත් ස්වයං නියාමන ක්‍රියාවලිය අලුත් හඳුන්වාදීමකි. මේ අතර ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම, කර්තෘවරුන්ගේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව (වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය) සහ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ප්‍රවෘත්ති කාමරවල කාර්ය මණ්ඩල දැනුවත් කිරීම මෙන්ම මාධ්‍යවේදීන් සඳහා වැඩමුළු ද පවත්වයි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ බලපෑම මැනබැලිය හැකි ආකාර ගණනාවක් පවතී. එක් ආකාරයක් නම්, කොමිසම වෙත ලැබුණු පැමිණිලි සංඛ්‍යාව සහ ඒ වෙනුවෙන් කොමිසම දක්වන ලද උනන්දුවයි. එය පහත දක්වා තිබේ. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ තවත් බලපෑමක් නම්, කොමිසමේ මැදිහත්වීමකින් තොරව ශ්‍රී ලංකාවේ

පුවත්පත් විසින් පළ කරනු ලැබූ නිවැරදි කිරීම්, පිළිතුරු දීමේ අයිතිය භාවිතා කිරීමේ අවස්ථාවන් සලසා දීම් සහ කනගාටුව පළ කිරීම් සංඛ්‍යාව ඉහළ ගොස් තිබීමයි. කොමිසම විසින් ඉටු කරනු ලැබූ උපදේශාත්මක කාර්‍යය භාර්යයට ධනාත්මක සහ වෘත්තීය මාධ්‍යවේදයක ඉලක්ක සපුරා ගැනීමට හේතුවන පරිදි කොමිසමේ ක්‍රියාවලියෙන් බැහැරව පාඨකයන් සෘජුවම කර්තෘවරු වෙත ලිවීමත් සිය පිළිතුරු දීමේ අයිතිය ලිඛිතව ලබා ගැනීමත් පෙන්වා දිය හැකිය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම අධ්‍යාපන අමාත්‍යාංශය සමග එක්ව සැප්තැම්බර් මස 15 දින ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේදී භාෂා තුනෙන්ම පැවැත්වූ දීප ව්‍යාප්ත රචනා තරගාවලිය අප කොමිසම සිව්වන සංවත්සරය වෙනුවෙන් තැබූ සළකුණකි. එම තරගාවලියේ ප්‍රථම කොටස පැවැත්වූ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 12 ශ්‍රේණි සිසු සිසුවියන් අතරින් පළාත් මට්ටමින් ප්‍රථම දෙවන සහ තුන්වන ස්ථාන ලබා ගත් ජයග්‍රාහකයින් 72 නෙකුගේ නාම ලේඛන අප කොමිසම වෙත ලබා දෙන ලදි. අනතුරුව එම සිසු සිසුවියන් කොළඹට කැඳවා මාතෘකා පහක් අතුරෙන් එක් මාතෘකාවක් තෝරාගෙන පැය 1 යි, වි 30 කාලයක් තුළදී වචන 750 ක රචනාවක් ලිවීමට සලස්වා අවසානයේදී සෑම භාෂාවකින්ම ප්‍රථම දෙවන සහ තෙවන ස්ථාන ලබාගත් තිදෙනා බැගින් ජයග්‍රහණය කළ නව දෙනා සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය පුවත්පත් සංගමයේ විධායක අධ්‍යක්ෂිකා ලින්ඩ්සේ රෝස් මහත්මිය අතින් ත්‍යාග ප්‍රධානය කරන ලදි. ප්‍රථම ස්ථානය සඳහා රු 5000/-ක් දෙවන ස්ථානය සඳහා රු 4000/-ක් තෙවන ස්ථානය සඳහා රු 3000/-ක් වටිනා පොත් ලබාගත හැකි වවුචර ත්‍යාග වශයෙන් ප්‍රදානය කළේය. එම සිසු සිසුවියන් සමග පැමිණි දෙමවුපියන් සඳහා උදෑසන ආහාර ලබා දුන් අතර ඔවුන් වෙත ගමන් ගාස්තු ද ලබා දෙන ලදි.

හොඳ පිටු සැලසුම්, පැහැදිලි සහ සරල මෙන්ම පහසුවෙන් තේරුම්ගත හැකි ශීර්ෂ පාඨ මගින් හොඳ ඡායාරූප මගින් විශේෂයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වන පුවත්පත්, පුවත්පතට ගෞරවයක් හා ඉහළ විශ්වසනීයත්වයක් ඇතිවන ආකාරයට මූලාශ්‍ර සඳහන් කරමින් තම අන්තර්ගතය වර්ධනය කරගෙන ඇත. දෙමළ පුවත්පත් ද නිවැරදි වාර්තාකරණයේ වගකීම ඉහළ මට්ටමකින් පෙන්නුම් කර ඇත. අවාසනවකට මෙන් වෘත්තීය ප්‍රතිපත්ති මාලාව උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් දත්තමය වශයෙන් වූ පැමිණිලි වැඩි ප්‍රමාණයක් ලැබෙනුයේ සිංහල පුවත්පත් සම්බන්ධයෙනි.

**ස්ත්‍රී පුරුෂ සමාජ භාවය**

මාධ්‍යවේදීන් ගේ මෙන්ම සිවිල් සමාජ සාමාජිකයන් ගේ පුහුණු වැඩමුළු සඳහා කාන්තා සහභාගීත්වය සීමාසහිත මට්ටමක පැවතීම අවාසනාවන්ත තත්ත්වයකි. මෙවැනි වැඩමුළු වලට සහභාගිවන කාන්තාවන් සහ පිරිමින් අතර අනුපාතය සාමාන්‍යයෙන් 3:20 කි.වැඩසටහන් පැවැත්වෙන ස්ථානය වෙත සිය නිවෙස්වල සිට ඇති දුර ගමන් කිරීමේ අපහසුව කාන්තා සහභාගීත්වය අඩුවීමට එක් හේතුවක් ලෙස සැලකිය හැකිය. තවත් සාධකයක් වන්නේ සාමාන්‍යයෙන් දින තුනක් සහ රාත්‍රි දෙකක් වැනි කාලයක් ගන්නා නේවාසික පුහුණු වැඩසටහන්වලට සහභාගිවීමට මාධ්‍යවේදිනියන් හට ඔවුන්ගේ මවුපියන් හෝ ස්වාමිපුරුෂයන් ගෙන් දිරිගැන්වීමක් නොලැබීම ය.

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය නැවත ක්‍රියාත්මක කිරීමට උත්සාහයක්**

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ නියෝජිත පිරිසක් පසුගිය 2007 වර්ෂයේ අගෝස්තු මාසයේදී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ අනුෂ පැල්පිට මහතා මුණගැසී ශ්‍රී ලංකා පුවත්පත්

පැමිණිලි කොමිසම පිහිටුවීමේ පසුබිම සහ එහි වත්මන් භූමිකාව සම්බන්ධයෙන් සාකච්ඡා කළහ. පුවත්පත් මණ්ඩලය නැවත පණගැන්වීමට එරෙහි ජනමාධ්‍ය සංවිධානවල සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ නියෝජිත පිරිසක් එම සාකච්ඡාවට සහභාගි වූහ.

**පැමිණිලි**

මෙවර සමාලෝචනයට ලක්වන කාලය තුළ (2007 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා)

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත පැමිණිලි 125 ක් ලැබී ඇත. එම පැමිණිලි ප්‍රමාණය එම පුවත්පත් පළවන මාධ්‍යය අනුව වර්ග කර බැලුවහොත්,

- සිංහල මාධ්‍යයයෙන් පළවන පුවත්පත්වලට එරෙහිව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 92 කි.
- දෙමළ මාධ්‍යයයෙන් පළවන පුවත්පත්වලට එරෙහිව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 13 කි.
- ඉංග්‍රීසි මාධ්‍යයයෙන් පළවන පුවත්පත්වලට එරෙහිව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 20 කි.

එසේ වර්ග කිරීමේ දී පෙනීයන කාරණය නම්, රට තුළ විශාල පාඨක පිරිසක් සිටින සිංහල මාධ්‍යයයෙන් පළවන පුවත්පත්වලට එරෙහිව වැඩි පැමිණිලි ප්‍රමාණයක් ලැබී ඇති බවයි.රට තුළ පළවන දිනපතා සහ සතිපතා පුවත්පත්වලින් සියයට 70 ක් පමණ සමන්විත වන්නේ සිංහල මාධ්‍යයෙන් පළවන පුවත්පත්වන අතර වෘත්තීය ප්‍රතිපත්ති මාලාව අනුගමනය කිරීම සඳහා සිංහල මාධ්‍යය කර්තෘවරුන්ගේ සහයෝගය දිනාගැනීමේ දී, හොඳ සහයක් ලබා ගැනීමට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සමත්ව ඇත. දෙමළ මාධ්‍යය පුවත්පත්වල කර්තෘවරුන් ගේ පූර්ණ සහයෝගය ලබා ගැනීමට හැකිව තිබියදී ඉංග්‍රීසි මාධ්‍යය පුවත්පත් තුනක් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ රීති සහ ක්‍රියාමාර්ග සමග බැඳීමක් ඇතිකර ගැනීමට මැලිකමක් දක්වයි.

අවධානයට යොමුවන කාලය තුළ ලැබුණු පැමිණිලිවල ස්වරූපය පහත දැක්වේ.

(1) ලැබී ඇති පැමිණිලිවල ස්වරූපය,

- වෘත්තීය ප්‍රතිපත්ති මාලාවට අදාළ නොවන (වලංගු නොමැති) පැමිණිලි සංඛ්‍යාව 56 කි. එම පැමිණිලි වෘත්තීය ආචාර ධර්ම මාලාවේ ඇතුළත් වගන්තිවලින් සඳහන්වන කාරණාවලට සම්බන්ධයක් නොමැත. උදහරණ වශයෙන් වෙළඳ ප්‍රචාරක දැන්වීම් ආදිය පිළිබඳව ලැබෙන පැමිණිලි.ගැඹුරු ලිපි සමග ප්‍රචාරක දැන්වීම් ස්ථානගත කිරීම මෙන්ම ලිපි මිශ්‍රකොට පළ කිරීම, මාණ්ඩලික මාධ්‍යවේදීන් සහ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් එකම කරුණක් අරබයා ලියූ ලිපි සහ නම් මිශ්‍ර කිරීම ආදී වශයෙන් හඳුනාගත හැකිය.
- විසඳුණු පැමිණිලි සංඛාව 25 කි. මෙය පසුගිය 2006 වසර සමග සංසන්දනය කිරීමේ දී වර්ධනයකි. ඒ අනුව බැලීමෙ දී වළංගු සහ විසඳුම් ලබා දී ඇති පැමිණිලි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස සියයට 36 කි.
- වසා දැමුණු පැමිණිලි සංඛ්‍යාව 44 කි. එවන් ආකාරයේ පැමිණිලි ඉදිරියට පවත්වාගෙන යාමට නොහැක. අධිකරණ ක්‍රියාමාර්ගයක පවතින පැමිණිලි, පැමිණිලිකරුවන් අදාළ තොරතුරු සහ කාරණා සම්පූර්ණ නොකළ පැමිණිලි, සහ කර්තෘවරුන් ගෙන් සෑහීමකට පත්විය නොහැකි ප්‍රතිචාර ලැබීම නිසා තව දුරටත්

ක්‍රියාවලිය ඔස්සේ ඉදිරියට ගෙනයාමට නොහැකි පැමිණිලි වේ.(එවන් පැමිණිලි තුනක් වසා දැමුණි).

- එම පැමිණිලි ඉදිරිපත්ව ඇත්තේ පහත සඳහන් පුවත්පත්වලට අදාළවය

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට (ලේක්හවුස් සමූහයට) අයත් පුවත්පත් - ඩේලි නිව්ස්, දිනමිණ, සන්ඩේ ඔබ්සර්වර්, සිළුමිණ, තිනකරන්

විජය පුවත්පත් සමාගමට අයත් පුවත්පත් - ලංකාදීප, ඉරිදා ලංකාදීප, සිරිකත

උපාලි පුවත්පත් සමාගමට අයත් පුවත්පත් - දිවයින,දිවයින ඉරිදා සංග්‍රහය,ද අයිලන්ඩ්, සන්ඩේ අයිලන්ඩ්

සුමති පුවත්පත් සමාගමට අයත් පුවත්පත් - දිනපතා ලක්බිම සහ ඉරිදා ලක්බිම

රාවය පුවත්පත් සමාගමට අයත් පුවත්පත් - රාවය

ලීඩර් පුවත්පත් සමාගමට අයත් පුවත්පත් - සන්ඩේ ලීඩර් පුවත්පත

මාස් මීඩියා සින්ඩිකේට් සමාගමට අයත් පුවත්පත් - සුඩරෝලි සහ උදයන්

රිවිර මීඩියා කෝපරේෂන් සමාගමට අයත් පුවත්පත් - ද නේෂන්

ලංකා එක්ස්ප්‍රස් පුවත්පත් සමාගමට අයත් පුවත්පත් - වීරකේසරී

යුනයිටඩ් පුවත්පත් සමාගමට අයත් පුවත්පත් - තිනකුරල්

(3) **වෙනත් පැමිණිලි**

පුවත්පත්වල පළකළ වෙළඳ දැන්වීම් කිහිපයකට එරෙහිවද කර්තෘ මාණ්ඩලිකයින් ගේ සහ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ගේ ප්‍රවෘත්ති මිශ්‍ර කර පළකිරීම, වාර්තා සඳහා දීමනා නොලැබුණු බවට සහ විද්‍යුත් මාධ්‍යවල ප්‍රවෘත්ති සහ වෙනත් වැඩසටහන් පිළිබඳ පැමිණිලි කිහිපයක් ද ලැබුණි. එම පැමිණිලි අදාළ බලධාරීන්ගේ අවධානය සඳහා යොමු කර ඇත.

(4) **පාඨක අයිතිය**

පාඨක අයිතිය පිළිබඳ නිවේදනය පළකිරීමට සියලුම පුවත්පත් ආයතන වෙත යොමු කළේය. ලංකා එක්ස්ප්‍රස් පුවත්පත් සමාගම, විජය පුවත්පත් සමාගම, සුමති පුවත්පත් සමාගම,යුනයිටඩ් පුවත්පත් සමාගම යන ආයතනවලට අයත් පුවත්පත් සහ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට අයත් තිනකරන් පුවත්පත ද එම නිවේදනය පළ කළහ.

**ආරවුල් නිරාකරණ මණ්ඩලය**

මාස දෙකකට වරක් රැස්ව සාකච්ඡා කිරීමට ගත් තීරණයට අනුව ආරවුල් නිරාකරණ මණ්ඩලය අවස්ථා නවයකදී රැස්ව ඇත. සමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සභාපතිවරයා වන්නේ කලක් පාර්ලිමේන්තුවේ මහ ලේකම් වරයා වශයෙන් මෙන්ම දුක්ගන්නාරාල ( ඔම්බුඩ්ස්මන්වරයා ) වශයෙන් කටයුතු කළ සෑම් විජේසිංහ මහතාය. වසර තුනක සිය සේවා කාලය සම්පූර්ණ කරතිබූ ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සභාපතිවරයාගේ නිල කාලය තවත් වසර තුනකින් දීර්ඝ කිරීමට, ඔක්තෝබර් මාසයේ පැවති වාර්ෂික මහා සමුළුවේ දී තීරණය කළහ. ආරවුල් නිරාකරණ මණ්ඩලයේ ජනමාධ්‍ය නියෝජිතයන් වන්නේ මල්ලිකා වණිගසුන්දර, බී එච් පෙරේරා, සිරි රණසිංහ, ජයතිලක ද සිල්වා සහ ප්‍රමෝද් සිල්වා යන මහත්ම මහත්මීහුය. ජනමාධ්‍ය නොවන නියෝජිතයන් ලෙස ආචාර්ය දෙවනේසන් නේසය්යා, සිත්ති තිරුවෙල්වම්, ජාවේඩ් යුසුෆ, ලුසිල් විජේවර්ධන සහ ඩයන් ස්කූමන් යන මහත්ම මහත්මීහු කටයුතු කරති.

**වෘත්තීය ප්‍රතිපත්ති මාලාව සමාලෝචනය කිරීමේ කමිටුව**

ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ ආරාධනය පරිදි මහා බ්‍රිතාන්‍ය කර්තෘවරුන් ගේ ආචාර ධර්ම කමිටුවේ ලේකම් ඉයන් බීල්ස් මහතා පසුගිය 2007 වසරේ ඔක්තෝබර් මස 17 සිට 23 දක්වා මෙරට සංචාරයක නිරත විය. වෘත්තීය ප්‍රතිපත්ති මාලාව කෙරෙහි අවධානය යොමු කළ හෙතෙම කර්තෘ සංසදය වෙත වාර්තාවක් ඉදිරිපත් කළේය. එම වාර්තාව කර්මාන්තයේ ප්‍රධාන කොටස්කරුවන් වෙතත් එහි පිටපතක් පුවත්පත් පැමිණිලි කොමිසම වෙතත් ලබා දුන්නේය. (එම වාර්තාව ඇමුණුම අංක 01 වශයෙන් ඇතුළත්කොට ඇත)

වසර තුනකින් සමාලෝචනය කර නොතිබූ මුද්‍රිත මාධ්‍යවේදීන් සඳහා පවතින වෘත්තීය ප්‍රතිපත්ති මාලාව සමාලෝචනය කිරීම සඳහා කොමිසම විසින් සමාන්තර සමාලෝචන කමිටුවක් ද පත් කරන ලදි. එම කමිටුව සඳහා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සාමාජික සිත්ති තිරුචෙල්වම්, ජාවේඩ් යුසුෆ, ඩේලිමිරර් පුවත්පතේ හිටපු කර්තෘ නිස්තාර් කාසිම්, නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ සාමාජික මෙන්ම ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික උවිදු කුරුකුලසූරිය යන මහත්ම මහත්මීහු ඇතුළත් වූහ. පසුව නිස්තාර් කාසීම් මහතා වෙනුවට එම්.එස්.එම්.අයූබ් මහතා වෘත්තීය ප්‍රතිපත්ති මාලාව සමාලෝචනය කිරීමේ කමිටුවට සහභාගි විය. සමාන්තර සමාලෝචන කමිටුව පත්කරනු ලැබුවේ අන්තර් ජාතික අධිකරණයේ හිටපු උප සභාපති හා විනිසුරු,ආචාර්ය ක්‍රිස්ටෝපර් වීරමන්ත්‍රී මහතාගේ ප්‍රධානත්වයෙනි. සිවිල් සමාජයේ ගෞරවයට පාත්‍රවූ විද්වතුන් කිහිප පළකගෙන් සහ ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදීන්ගෙන් සමන්විතවූ එම කමිටුවට, කර්තෘ සංසදය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාන්තර සමාලෝචන කමිටුව පත්කෙරුණි. විවිධ හේතූන් මත මූලික කමිටුවට රැස්වීමට හැකි වූයේ එක් වරක් පමණි. විශේෂයෙන් එම කමිටුවේ සමහර සාමාජිකයින් රජකාරී කටයුතු සඳහා දිවයිනෙන් බැහැරව සිටි බැවින් එම කමිටුවට වාර්තාවක් සැකසිය නොහැකි විය. ඉයන් බීල්ස් මහතාගේ සහ සමාන්තර සමාලෝචන කමිටුවේ වාර්තා දෙක ලබා ගත් කර්තෘ සංසදය ඔවුන්ගේ අවසන් සමාලෝචන වාර්තාව සැකසූහ. (එම වාර්තාව ඇමුණුම අංක 02 වශයෙන් ඇතුළත්කොට ඇත.)

**රූපවාහිනී මාධ්‍යවේදීන් සඳහා වෘත්තීය ආචාර ධර්ම මාලාවක්**

රූපවාහිනී කර්මාන්තයේ මාධ්‍යවේදීන්ට වෘත්තීය ප්‍රතිපත්ති මාලාවක් සැකසීම සඳහා ඉදිරිපත් වූ ඉල්ලීම අනුව කටයුතු කිරීමේ හැකියාවක් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමට නොමැති වුවද යහපත් චේතනාවෙන් යුතුව එම්. ටී. වී, අයි. ටී. න්, ඊ. ටී. වී, ස්වර්ණවාහිනී, ටී. එන්. එල්, සහ දෙරණ රූපවාහිනී ආයතනවල සාකච්ඡාවලට ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය ඔස්සේ පැමිණිලි කොමිසම පහසුකම් සැපයුවේය.

**ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සාමාජිකත්වය**

ලේක්හවුස් ආයතනයේ ඉංග්‍රීසි ප්‍රකාශන අංශයේ ප්‍රධාන කර්තෘ වශයෙන් කටයුතු කළ අජිත් සමරනායක මහතා ගේ අභාවයෙන් පසු පුරප්පාඩු වූ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සාමාජිකත්වයට ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් ඩේලි නිව්ස් පුවත්පතේ ප්‍රධාන කර්තෘ බන්ධුල ජයසේකර මහතා නම් කරන ලදි. කෙසේ වෙතත් බන්ධුල ජයසේකර මහතා සිය කර්තෘ ධූරයෙන් ඉවත්වීමත් සමග එම සාමාජිකත්වය නැවතත් පුරප්පාඩු විය. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සාමාජිකත්වයට නිදහස් මාධ්‍ය ව්‍යාපාරයෙන් නම් කර තිබූ කමල් ලියනආරච්චි මහතා එම කොමිසමේ නව සිංහල පැමිණිලි නිලධාරීවරයා

වශයෙන් සේවයට එක්විය. ඔහුගේ පුරප්පාඩුව සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් තරිඳි ෆොන්සේකා මහත්මියව නම් කරන ලදි. 2007 වසරේ දෙසැම්බර් 31 දින වනවිට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමාසමේ සාමාජිකත්වය 49 ක් විය.

## දැනුවත් කිරීම්

### ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ප්‍රවර්ධන ප්‍රචාරක ව්‍යාපාරය

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ප්‍රචාරක කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ වැඩපිළිවලට අනුමතිය ලැබුණි. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිබඳ සඳහන් පත්‍රිකාවක් සැකසීම, මහජනසේවා නිවේදනයක් ලෙස ප්‍රචාරය කිරීම සඳහා "පිළිතුරු දීමේ අයිතිය" පිළිබඳ සඳහන් පුවත්පත් දැන්වීම් මෙන්ම රූපවාහිනී සහ ගුවන්විදුලි දැන්වීම් ද විකාශනය කිරීම, බම්බලපිටිය, කිරුළපණ, කොටුව සහ නුවර පාර යන ස්ථානයන් හි දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම එම ප්‍රචාරක වැඩපිළිවලට අයත් විය.

- ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිබඳ නිරන්තරයෙන් අසන ප්‍රශ්න පිළිබඳව සඳහන් පත්‍රිකාවක් පරිවර්තනය කර මුද්‍රණය කිරීමට තීරණය කෙරුණි.

## වැඩමුළු සහ සම්මන්ත්‍රණ

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ කාර්ය භාර්යය පිළිබඳව පොදු ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් බණ්ඩාරවෙල, බදුල්ල, රත්නපුර, කෑගල්ල, සහ හලාවත යන ස්ථානයන් හි පැවැත්වුණි. එම වැඩසටහන සඳහා ගුරුවරු, රජයේ නිලධාරීන්, පළාත්පාලන ආයතනයන් හි නිලධාරීන්, බුද්ධිමතුන් සහ වෛද්‍යවරු සහභාගි වූහ. ඔවුහු ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සහ එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් කරුණු දැනගැනීමට බෙහෙවින් උනන්දු වහ.

බණ්ඩාරවෙල, බදුල්ල, රත්නපුර, කෑගල්ල, සහ හලාවත යන ප්‍රදේශයන් හි ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා වෘත්තීය ආචාර ධර්ම පිළිබඳ දැනුවත් කිරීමේ දෙදින වැඩමුළු ගණනාවක් පැවැත්වූහ.

- ඉන්ටර්නිව්ස් ආයතනය විසින් මාතර ගුවන්විදුලි මාධ්‍යවේදීන් සඳහා පැවැත්වූ වැඩමුළුවක දී ඔවුන්ව ජනමාධ්‍ය ආචාර ධර්ම පිළිබඳව දැනුවත් කරන ලදි.

- ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ කාර්ය භාර්යය පිළිබඳව ශ්‍රී ලංකා කිතුනු සභාවේ කොළඹ දියෝකීසියේ දේවස්ථාන නියෝජිත සම්මේලනය වෙත ඉදිරිපත් කිරීමක් පැවැත්වුණි. පැමිණිලි විසඳීම සඳහා අප කටයුතු කරන ආකාරය පිළිබඳව තේරුම් ගැනීමට පහසුවන ආකාරයට සැකසූ පරිගණක දර්ශන තල මගින් මගින් දැනුවත් කිරීම සිදු විය.

- ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ කාර්ය භාර්යය පිළිබඳව රතු කුරුස සහ රතු චන්ද්‍රවංක සමාජවල ජාත්‍යන්තර සම්මේලනයේ නියෝජිතයන් සහ එම සංවිධානවල සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කළේය.

- ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ කාර්ය භාර්යය පිළිබඳව මානුෂවාදී නියෝජිත සමූහය (සී. එච්. ඒ.) ආයතනය දැනුවත් කළේය. එයද පෙර වැඩසටහන් මෙන් විය. නමුත් මාධ්‍යවේදීන් ඇමතීමේදී විශේෂ සැලකිල්ලක් දක්වන ලෙස එයට සහභාගිවූවන්ගෙන්, ඉල්ලා සිටියේය. මාධ්‍ය විසින් බොහෝ අවස්ථාවලදී ඔවුන්ව වැරදි ලෙස උපුටා දක්වන හෙයින් පුවත්පත් නිවේදන කෙරෙහි විශ්වාසය තබා කටයුතු කරන ලෙස ද පැවසුවේ ය.

**මුලපිරීම්/පුහුණු කිරීම්**

- මහා බ්‍රිතාන්‍ය පුවත්පත් පැමිණිලි කොමිසමේ ආරාධනයකට අනුව ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ප්‍රධාන විධායක නිලධාරීවරයා සැප්තැම්බර් මස 18 සිට 22 දක්වා ස්කොට්ලන්තයේ එඩින්බර්ග් හි පිහිටි යුරෝපා සමුළුවේ ස්වාධීන පුවත්පත් මණ්ඩල සංධානයේ සම්මන්ත්‍රණයකට සහභාගි විය. ප්‍රධාන විධායක නිලධාරීවරයා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ 2006 වසරේ වාර්ෂික වාර්තාවක් ඔවුන් වෙත ඉදිරිපත් කළේ ය.
- මහා බ්‍රිතාන්‍ය පුවත්පත් පැමිණිලි කොමිසමට ද සහභාගි වූ ප්‍රධාන විධායක නිලධාරීවරයා එහිදී පැහැදිලි කිරීමක් ද ඉදිරිපත් කළේය. සැප්තැම්බර් මාසයේ දී පැවති යුරෝපා සමුළු සම්මන්ත්‍රණයෙන් පසු ප්‍රධාන විධායක නිලධාරි වරයා සවිස්තර අවබෝධයක් ලබා ගැනීම පිණිස මහා බ්‍රිතාන්‍ය පුවත්පත් පැමිණිලි කොමිසමට සහභාගි විය.

**කර්තෘවරු හමුවීම**

සිය පැමිණිලි නිලධාරීන් තිදෙනා සමග පුවත්පත් කාර්යාලයන්හි සංචාරය කළ ප්‍රධාන විධායක නිලධාරීවරයා එම පුවත්පත් හි කර්තෘවරු සහ ප්‍රවෘත්ති කාමරවල කාර්යමණ්ඩල සාමාජිකයින් සමග වෘත්තීය ආචාර ධර්ම මාලාව සහ පුවත්පත් පැමිණිලි කොමිසමේ කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කළහ.

**ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කෙමිසමේ මෘදුකාංග පද්ධතිය**

බ්‍රිතාන්‍ය පුවත්පත් පැමිණිලි කොමිසමේ මෘදුකාංග පද්ධතියට සමාන ආකාරයට නිර්මාණය කර ඇති ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ මෘදුකාංග පද්ධතිය 2006 වසරේ අග භාගයේ සිට ක්‍රියාත්මක වේ. පැමිණිලිකරුවන්ට දැන් ඒ හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලැබී ඇත. තවද එමගින් ජනමාධ්‍යවේදීන් සඳහාවන වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය සහ පැමිණිල්ලක් විසඳගැනීම සඳහා පියවර ගන්නා ආකාරය පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි ය.

**වාර්ෂික සමුළුව සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ අධ්‍යක්ෂ මණ්ඩලය සෑම මසකට වරක්ම රැස්වේ.2007 වසරේ වාර්ෂික මහා සමුළුව ඔක්තෝබර් 02 දින පැවැත්වුණි. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ මීළග මාස 12 සඳහා අධ්‍යක්ෂවරු නව දෙනාම නැවත තෝරා පත්කර ගැනුණි. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සභාපතිවරයාගේ ධූර කාලය තවත් වසර තුනකින් දීර්ඝ කිරීම සඳහා, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පිහිටුවීමේ සමාගම් ලියවිල්ලේ 65 ඩී වගන්තිය සංශෝධනය කර සම්මත කෙරුණි.

අධ්‍යක්‍ෂ මණ්ඩලය : රංජිත් විජේවර්ධන මහත්මා (සභාපති - ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ යෝජනාවකි ) නිමල් වෙල්ගම මහත්මා (පුවත්පත් ප්‍රකාශකයින් ගේ සංගමයේ යෝජනාවකි ) සිංහ රත්නතුංග මහත්මා (ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ යෝජනාවකි )උවිඳු කුරුකුලසූරිය මහත්මා (නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ යෝජනාවකි ) වරුණ කරුණාතිලක සහ මනික් ද සිල්වා මහත්වරු දෙපළ (ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ යෝජනාවකි ) නාමිණී විජේදාස මහත්මිය, එම්, එන්, අමීන් මහත්මා සහ සුන්දර නිහතමානි ද මැල් මහත්මා ( පුවත්පත් පැමිණිලි කොමිසමේ නිලවරණයෙන් තේරී පත්වූහ. )

**කාර්යමණ්ඩල සාමාජිකයින්**

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ප්‍රථම ප්‍රධාන විධායක නිලධාරිණී මැණික් මෙන්ඩිස් මහත්මිය 2005 වසරේදීත් උපදේශක මෙන්ම සිංහල පැමිණිලි නිලධාරි එස්.දම්මුල්ල මහතා 2006 දෙසැම්බර් මාසයේදීත් ඉල්ලා අස්වීම හේතුවෙන් එම ධූර පුරප්පාඩු විය. නව ප්‍රධාන විධායක නිලධාරිවරා ලෙස සේවයට එක් වූ සුකුමාර් රොක්වුඩ් සහ සිංහල පැමිණිලි නිලධාරි වරයා වශයෙන් බඳවාගත් කමල් ලියනආරච්චි සමග එම කාර්ය මණ්ඩලය,ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම 2007 වසර සඳහා සිය පූර්ණ ශක්තිය යොදමින් කටයුතු කර ඇති බව පෙන්වා තිබේ.

ඉංග්‍රීසි පැමිණිලි නිලධාරිනිය ලෙස කටයුතු කළ ක්ෂාමා රණවන ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ මාධ්‍ය නිදහස සහ උපදේශන අංශයේ කළමනාකරු වශයෙන් පත්වීම ලැබීමෙන් පසු ඉංග්‍රීසි පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමට සුකුමාර් රොක්වුඩ් මහතා පත් කෙරුණි. දෙමළ පුවත්පත් සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අමීන් හුසේන් මහතා කටයුතු කරයි.

ඇමුණුම අංක - 01

# ශ්‍රී ලංකාවේ පුවත්පත්හි ස්වයං නියාමනය සමාලෝචනයක්

**ඉයන් බීල්ස් . 2007 නොවැම්බර්**

## විධායක මණ්ඩලයේ සංක්ෂිප්ත විවරණය

මගේ ඔක්තෝබර් සංචාරයේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ තක්සේරුවක් කිරීමය. එහෙත් ගැටලුව ආචාර ධර්ම පද්ධතිය නොවන බව ඉක්මනින්ම අනාවරණය විය. ශ්‍රී ලංකාවේ පුවත්පත්හි ස්වයං නියාමනය කරා යොමු වුණු අපේක්ෂා සහගත ගමන එහි අවසාන අභිප්‍රාය පිළිබඳ මූලික අනවබෝධය නිසා ඇනහිට ඇති බවක් පෙනීයයි. පුවත්පත් හා සඟරාවලට එරෙහිව පොදු ජනතාවගෙන් ඉදිරිපත් වන යුක්ති සහගත දුක්ගැනවිලිවලදී ඊට ප්‍රතිකර්ම යෙදීම සඳහා පුවත්පත් නිදහසට නොගැළපෙන අන්දමේ සීමාන්ත හා හානිකර නෛතික රෙගුලාසි උපයෝගී කොට නොගෙන කාහටත් පිළිගත හැකි ලිහිල් පියවර ගන්නා පාලනායතනයක් පිහිටුවීම එකී අවසාන අභිප්‍රාය වූයේය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේත් කර්තෘ සංසදයේ හා පුළුල් වශයෙන් පුවත්පත් කර්මාන්තයේත් අභ්‍යන්තරයෙහි සිදුවූ පුද්ගල හා අවස්ථානුකූල වෙනස්කම් නිසා එකී අරමුණ අහෝසි වී ඇති බවක් පෙනෙන්නට තිබේ. තමා නොසලකා හරිනු ලැබ ඇතැයිද පිළියම දැඩි රෙගුලාසිමයැයිද ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම අදහස් කරයි. ඒ උපාය මාර්ගය, ස්වයං නියාමනය වෙනුවෙන් ස්වේච්ඡාවෙන් කැප වන්නන්ගේ පරමාර්ථයට පටහැනි වන්නක් පමණක් නොව කර්තෘවරුන් ඔවුන්ගේ ක්ෂේත්‍රය තුළ රැඳී සිටීම සඳහා පොළඹවන්නකට වඩා පසුගාමී ප්‍රතිඵල ඇති කරන්නක් බවට පත්වීමටද ඉඩ තිබේ.

ස්වයං නියාමන වැඩපිළිවෙළ යළිත් නිසි මඟට ගැනීමට නම් එය ඉතා ඉක්මනින් ප්‍රතිශෝධනය විය යුතුය. ඒ සඳහා ප්‍රබල ප්‍රයත්නයක් අවශ්‍ය වනු ඇත. අතපසු වුණු අරමුණු සපුරා ගැනීම සඳහා අප්‍රකට පුනරාරම්භයක් සැබැවින්ම අවශ්‍ය වනු ඇත. සමාරම්භයේදී අපේක්ෂිත පොදු අරමුණු හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේත් එහි ලේකම් කාර්යාලයේ හා කර්තෘ සංසදයේත් අලුත් කැපවීමක් අවශ්‍යය. සමාරම්භක අරමුණු මෙසේ විය:

- ★ පුවත්පත් පැමිණිලි කොමිසම සිය අරමුණු යළි තක්සේරු කොට ගෙන ස්වකීය ප්‍රතිරූපය පොදු ජනතාව අතර මෙන්ම පුවත්පත් කර්මාන්තය තුළද වර්ධනය කරගැනීම සඳහා ද්විප්‍රකාර අධ්‍යාපනික වැඩ පිළිවෙළකට මුල පිරිය යුතුය. ස්වකීය පරමාර්ථය පිළිබඳ අවබෝධයකින් යුක්තව බලහත්කාරයෙන් හා තර්ජනයෙන් තොරව කරුණු ඒත්තු ගැන්නීමෙන් සිය අරමුණ ඉටු කර ගැනීමේ මඟකට පුවත්පත් පැමිණිලි කොමිසම පිවිසිය යුතුය.

- ★ වර්තමාන ස්වයං නියාමන පාලනායතනය ඉන් බැහැර සිටින්නන්ට වඩාත් පිළිගත හැකි තත්ත්වයට පත් කරනු පිණිසත් ඒ මඟින් එය විශ්වාසවන්ත ආයතනයක් බවට පත්වන පරිදි ජාත්‍යන්තර(හෝ බහුතරයකගේ) අනුකූලතාව ඊට හිමිවනු පිණිසත් වෙනස්කම් පිළිගැනීමට පුවත්පත් කර්මාන්තයෙහි නියුක්තවූවෝ ප්‍රකාශකයන්ගේ හා කතුවරුන්ගේ මට්ටමෙන් ක්‍රියාත්මක විය යුත්තෝය. ආචාර ධර්ම මාලාව සමාලෝචනය කිරීමත් ප්‍රතිශෝධනය කිරීම හා ප්‍රකාශයට පත් කිරීමත් සඳහා වඩාත් පුළුල් අංග අන්තර්ගත ආචාර ධර්ම කමිටුවක් පිහිටුවීමද ඒ ක්‍රියාදාමයට ඇතුළත් විය යුතුය.

දේශපාලන පරිසරය හේතු කොට ගෙන ඒ අරමුණ ඉෂ්ට කරගැනීම වඩාත් දුෂ්කර කාර්යයක් වන නමුත් එය සාර්ථක කරගැනීම වඩාත් හදිසි අවශ්‍යතාවකි. ඒ අතින් දැන් පවත්නා හිඩස ස්වයං නියාමනය සඳහා දැනට දෙන සහාය ආපසු හරවා ගැනීමටත් පුවත්පත් මණ්ඩලය යළි පිහිටුවීමටත් රජයට හේතුවක් විය හැකිය. පුවත්පත් කර්මාන්තයෙහි නියුක්තවූවන් වර්තමාන ව්‍යාපෘතිය වෙනුවෙන් හෘදයාංගමව කැප නොවුණ හොත් එය ආධාර මුදල් සඳහා අනාගතයේදී දැරෙන ප්‍රයත්න කෙරෙහිද දීර්ඝ කාලීන බාධක එල්ල කරන පසුබෑමක් විය හැකිය.

එසේ වුවහොත්, ස්වයං නියාමනය පිළිබඳ දීර්ඝ කාලීන සංකේතයක් කලාපයට ප්‍රදානය කළ හැකි අනර්ඝ අවස්ථාවක්, ශ්‍රී ලංකාව තවමත් සිටින කලාපයට අහිමිවනවා ඇත.

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම අවුරුදු හතරක කාලයක් තිස්සේ පවතී. ස්වයං නියාමන පාලනායතන සම්බන්ධයෙන් පවත්නා ජාත්‍යන්තර තත්ත්වය සමඟ සසඳන විට ශ්‍රී ලංකාවේ එම ආයතනයේ එකී පැවැත්මම ප්‍රසාද ජනකයැයි කිව යුතුය. මේ ගණයේ ඇතැම් කාර්ය පද්ධති එක්කෝ කෙමෙන් වියැකී අහෝසි වී යයි, නැතහොත්, අදාළ ක්‍රියාකාරීන්ගේ උදාසීනතාව, නොසැලකිල්ල, දුර්වල නායකත්වය, අභ්‍යන්තර අරගල, අරමුදල් ඌනතාව හෝ රාජ්‍ය පීඩනය.හෝ ඒ සියල්ලේම එකතුව නිසා මාස කීපයක් ඇතුළත වැසී යයි. එහෙයින් විශේෂයෙන්ම කෙමෙන් නරක අතට හැරෙන දේශපාලන පසුබිමක් හමුවෙහි මෙවැනි ආයතනයක හුදු පැවැත්මම පමණක් වුවද සුළු ජයග්‍රහණයක් නොවේ. එහෙත් එයම ප්‍රමාණවත් නොවේ. එහෙයින් මර්දනකාරී රාජ්‍ය අත පෙවීම්වලටද අධික වියදම් සහිත දීර්ඝ කාලීන අධිකරණ කාර්ය පද්ධතිවලටද විකල්ප වශයෙන් ස්වකීය මූලික අරමුණට අනුකූලව ක්‍රියාත්මකවන පලදායක හා ප්‍රබල ආයතනයක් බවට පත් වීමට නම් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම නිදහස් ප්‍රකාශනය නමැති උතුම් භූමිය මත සංකේත ධජයක් නැංවීමෙන් පමණක් නතර විය යුතු නොවේ. පුවත්පත්වලට එරෙහිව පොදු ජනතාවගෙන් ඉදිරිපත්වන අව්‍යාජ දුක්ගැනවිලි වෙනුවෙන් පලදායක ප්‍රතිකර්ම සපයන නිදහස් කඩිනම් සාධාරණ හා ස්වාධීන පියවර නමැති ආරක්ෂක ප්‍රාකාරයක් ඒ භූමිය මත නැංවීමටද කොමිසම කටයුතු කළ යුතුය. අභ්‍යන්තර වෛරයට හා ජාත්‍යන්තර හුදෙකලා භාවයටද බිය නොවී අතිශය අත්තනෝමතික ලෙස කටයුතු කරන මර්දනකාරී ආණ්ඩු පවා ප්‍රකාශන නිදහස පිළිබඳ මූලධර්මවලට අත පෙවීමෙන් වළක්වා ලීමට ප්‍රමාණවත් පුළුල් පොදුජන සහයෝගයක් මේ ආයතනය ලබා ගත යුතුය. එය ස්වයං නියාමනයේ අවසාන අභිප්‍රායයි.

ජනතා සහයෝගය නැති පුවත්පත ස්වාර්ථ සාධනීය අරමුණු මත ඒකරාශී වූ වාණිජ කණ්ඩායමකට වැඩි දෙයක් විය හැක්කේ ඉතා අල්ප වශයෙනි. එහෙත් එය ප්‍රබල සන්ධානයකි. අධිකාරී බලයක් සහිත ස්වයං නියාමන ක්‍රියාවලියකින් එවැනි සන්ධානයක් සඳහා ප්‍රබල පදනමක් නිර්මාණය කැරෙන අතර ප්‍රචාරයට පත්වන කරුණු පිළිබඳ විශ්වාසනීයත්වය හීන කරන, අනවශ්‍ය අතපෙවීම් සහිත රාජ්‍ය ආයතනයකට වඩා ස්වාධීන ස්වයං නියාමන ක්‍රියාවලියක් එවැනි සන්ධානයක් තුළ පවත්නා බව පොදු ජනතාව වටහා ගනිති. දෙපාර්ශ්වයෙන් කවරකට වුවද තමන්ගේ වාසිය සඳහා යොදා ගත හැකි අභ්‍යන්තර ගැටුමක් හා ජන වාර්ගික දුරස්ථ භාවයක්ද පවත්නා යුගයක තරම් අන් කවරදාකවත් එවැන්නක් වැදගත් නොවේ.

අපේක්ෂා සහගතව ආරම්භ වුවද ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පුවත්පතේ හා ජනතාවගේ වීරයකු වශයෙන් තහවුරු වී නැති බව දක්නට ලැබේ. පැහැදිලි ඒකාබද්ධතාවක් එහි නැත්තේය. වසර හතරකට පසු ස්වයං නියාමන ක්‍රියාදාමය නිශ්චලව තිබේ. ලැබෙන පැමිණිලිවල දුබලතාවෙන් ඇඟැවෙන්නේ ආයතනය පිළිබඳ ජනතා අවබෝධයත් ඒ කෙරෙහි ඔවුන්ගේ විශ්වාසයත් පහළ මට්ටමක පවත්නා බවයි. ඒ අතරම ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පුවත්පත් කර්මාන්තය සමඟ පවත්වන සම්බන්ධතා නිශ්චිත නොවන බවත් එහි කාර්ය භාරය අපැහැදිලි බවත් පෙනීයයි.

සාර්ථක ස්වයං නියාමන පාලනායතනයක් මඟින් උපරිම පල නෙළා ගත හැකි මෙම කර්මාන්තය තුළ අවිශ්වාසය හා උද්යෝගයක් නොමැතිකම පිළිබඳ බියකරු ලකුණුද ඇත්තේය. ස්වයං නියාමන ක්‍රියාවලියේ ආරක්ෂාව ලැබියයුතු පොදු ජනතාව හෝ එම කාර්ය පද්ධතිය නිර්මාණය කළ පුවත්පත් කර්මාන්තය හෝ ඒ කෙරෙහි විශ්වාසය නොතබන්නේනම් ඊට ඇත්තේ කෙබඳු අනාගතයක්ද? එය පැවැතිය යුත්තේ කුමක් පිණිසද? ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සාර්ථක වීමට නම් ඒ ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු විය යුතුය, ඉක්මනින් ඊට පිළියම් යෙදිය යුතුය. ඒ සඳහා තවමත් ප්‍රමාද නැත. එහෙත් කාලය වේගයෙන් ගෙවී යයි.

## 2. සිදු වන වරද කුමක්ද ?

රෝග නිධානය තහවුරු කිරීම කෙටි සංචාරයකදී කළ හැක්කක් නොවේ. එහෙත් අන් කුමක් වැරැදී තිබුණතද, වෘත්තීය ආචාර ධර්ම පද්ධතියෙහි එවැන්නක් සිදු වීමට ඉඩක් නැත්තේ එහි දුර්වලතා අනාවරණය කරනු පිණිස එය තීරකයන්ගේ පරීක්ෂණයට ප්‍රමාණවත් පරිදි භාජන වී නොමැති හෙයින් බව පහසුවෙන්ම පෙනී ගියේය. ඒකග්‍රතාවක් නැතිකම සැබැවින්ම ගැටලුවක් සේ දැක්විණි. එහෙත් ඒ, ආචාර ධර්ම මාලාවෙන් ප්‍රකාශ වුණු කරුණු නිසා නොව එය ක්‍රියාත්මක කැරුණු

ආකාරය නිසා බවද දක්නට ලැබිණි. ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ අනවබෝධය ද දුෂ්කරතාවක් වන නමුත් මෙහි දක්නට ලැබුණේ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සැබැවින්ම කුමක් සඳහාද එහි කාර්ය භාරයය කුමක්දයන්න පිළිබඳව අවබෝධය ඉතාම පටුවීමයි. ආචාර ධර්ම පද්ධතිය සමාලෝචනය නොවීම නොසැලකිල්ලකි. එහෙත් එය විනාශකාරී නොවේ. එම ලේඛනය අදාළත්වයෙන් මෙන්ම ප්‍රබලවද පවත්නා නමුත් යාවත්කාලීන තත්ත්වයට පත් කැරුණේ නම් එය වඩාත් ශක්තිමත් තත්ත්වයට පත්වන්නට ඉඩ තිබුණි. (යෝජනා කීහිපයක් 'බී' ඇමුණුමෙහි ඇතුළත් වෙයි.

කෙසේ වුවද එහි වාර්ෂික සමාලෝචනයක් සිදු නොවීම ගැටලුවේ සලකුණක් පමණක් බව පෙනී යයි. සැබෑ ව්‍යාධිය සඳහා අප බැලිය යුත්තේ වෙනත් පැත්තකි.
ළදරු අවස්ථාවෙහි පවත්නා අනෙක් ස්වයං නියාමන ආයතනවලට හානිකර වූ උදාසීනතාව අභ්‍යන්තර ආරවුල් හා නිසි අධීක්ෂණයක් නොමැතිකම යනාදී බොහෝ ව්‍යාධි ලක්ෂණ මෙහි පවත්නා බව ප්‍රකාශිත නොයෙක් මත පිළිබඳ අහඹු ගවේෂණයකින් අනාවරණය විය.

පුවත්පත් කර්මාන්තයේ අභ්‍යන්තරයෙහි මෙන්ම බාහිරවද ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම කුමක් සඳහාද යන්න පිළිබඳව එය තුළ ද ව්‍යාකූලතා පවතින බවට සාධකයක් තිබේ. අනවබෝධය කොතරම් පුළුල්ද යන වග උදාහරණ වශයෙන් පහත දැක්වෙන (පරස්පරතා සහිත) අදහස්වලින් පැහැදිලි වෙයි.

ප්‍රමාණවත් බලපෑමක් එයින් ඇති වී නැත. සාමාන්‍ය ජනතාව ආයතනය ගැන කරුණු නොදනී. එහෙයින් ඉදිරිපත් වන පැමිණිලි ඉතා අල්පය.

අපට එය අවශ්‍ය මක්නිසාදැයි කිසිවෙක් පුවත්පත් කලාවේදිනට කියා නැත.එහෙයින් ඔවුහු එය නොදනිති.

කර්තෘවරු පුරුද්දක් වශයෙන් ඔවුන්ගේම ආචාර ධර්ම පද්ධතිය නොසලකා හරිති. අනෙක් කිසිවෙක් එය අනුගමනය කළ යුත්තේ ඇයි?

සංසදයට අයත් නොවන කර්තෘවරු එයින් බැඳී නොසිටිති, එහෙයින් ජගත් අනුකූලතාවය ලබාගත නොහැක.

කෙසේ වුවද, එය පුවත්පත් කලාවේදීන්ගේ ආචාර ධර්ම නොවී කර්තෘවරුන්ගේ ආචාර ධර්ම විය යුත්තේ මක් නිසාද?

ආචාර ධර්ම මාලාව අවශ්‍ය පමණට විස්තරාත්මක නොවේ. එය විස්තරාත්මක විය යුතුය.

දිගින් වැඩිය. වඩා කෙටි වීම අවශ්‍යය.

පුවත්පත් පැමිණිලි කොමිසම කර්තෘවරුන් සමඟ සන්නිවේදනයෙහි නොයෙදේ.

කර්තෘවරු පුවත්පත් පැමිණිලි කොමිසම සමඟ සන්නිවේදනයෙහි නොයෙදේ.

කොමිසමත් කර්තෘවරුත් සාමාන්‍ය පුවත්පත් කලාවේදීන් සමඟ සන්නිවේදනයෙහි නොයෙදේ.

පුවත්පත් පැමිණිලි කොමිසමේ කාර්ය මණ්ඩලය අවශ්‍ය ප්‍රමාණයට වඩා අධිකය. දැනට සැපයෙන අරමුදල් අවසන් වූ පසු එහි නඩත්තුව පුවත්පත් කර්මාන්තයට වියදම් අධික කාර්යයකි.

කෙසේ වුවද, පැරණි නීතිගත පුවත්පත් මණ්ඩලයෙහි වූ වරද කුමක්ද?

ඒ, ආදර්ශ වශයෙන් දැක්විය හැකි කරුණු කීපයක් පමණකි. එසේ වුවද වඩාත් අදාළ වන කරුණුවලට උපකාරී වන සාක්කි ඇත්තේය.

**පළමුවැන්න**. ඇතැම් කර්තෘවරුන් පුවත්පත් පැමිණිලි කොමිසම සහමුලින්ම වර්ජනය කරන නිසාත් ඇතැමුන් වරින්වර කිසිදු පිළිවෙළක් නැතිව ඊට ඇතුළත් වෙමින් හා ඉන් බැහැර වෙමින් සිටින නිසාත් එහි අනන්‍යතාවක් හෝ විශ්වසනීයත්වයක් නැති බව ඇඟැවෙයි.

**දෙවැන්න**. කර්තෘ සංසදය එහි දායකත්වයෙන් ආරම්භ වුණු සංවිධානයට සාමාන්‍ය වශයෙන් සහයෝගය දක්වන අතර, ඒ සඳහා මුලදී තිබුණු උනන්දුව ඒ මට්ටමෙන්ම පවත්වා ගෙන යන්නට කටයුතු කර නොමැත. එයින් දැක්වෙන්නේ, අයිතිය තමන් සතු ආචාර ධර්ම මාලාව විධිමත්ව සමාලෝචනය කිරීමට කර්තෘ සංසදය අසමත්ව ඇති බවය. ආචාර ධර්ම පිළිබඳ සමාන්තර කමිටුව විසින් බාහිර වශයෙන් කරන ලද සමාලෝචනය අසාර්ථක වී ඇති අතර එය සංසදයේ කාර්ය භාරය ඉතා අවදානම් සහගත අන්දමින් බැහැර කිරීමකි. ආචාර ධර්ම මාලාව පිළිබඳ බාහිර සමාලෝචනය මඟින් සිවිල් සමාජය තුළ වැඩි අධිකාරී බලයක් හා විශ්වසනීය භාවයක් ඊට හිමි විය හැකි අතරම පුවත්පත් ක්ෂේත්‍රය තුළ ඒ කෙරෙහි විශ්වාසය හා අනුකූලතාව හීනවුවහොත් එය ඉතා පහසුවෙන්ම බල රහිත විය හැක්කේය. කර්තෘ සංසද ආචාර ධර්ම කමිටුව හෝ එවැනි වෙනත් සන්ධානයක් මඟින් ආචාර ධර්ම මාලාව සම්බන්ධයෙන් පුවත්පත් කර්මාන්තයට අත්වන අයිතිය අනුකූලතාව දිරිගන්වන මාර්ගයකි.

**තුන්වැන්න**. ස්වයං නියාමන අවශ්‍යතාව සම්බන්ධයෙන් පවා පුවත්පත් බෙදී සිටී. රජයේ ලේක්හවුස් පුවත්පත් පවා බෙදී සිටින බව පෙනී යන්නේ ඩේලි නිව්ස් පත්‍රය සංසදයට සම්බන්ධව සිටීමත් ඔබ්සර්වර් පත්‍රය ඊට නොබැඳී සිටීමත් නිසාය. අනෙක් අතට ලීඩර් පුවත්පත විරුද්ධව සිටින බව පෙනේ. මේ සියල්ල හේතුකොට ගෙන ඒ කෙරෙහි පොදු ජනතා විශ්වාසය බිඳී යයි. ස්වයං නියාමන ක්‍රියාවලිය කුමක් සඳහා පවත්නේද යන්න පුවත්පත් පවා සැබැවින්ම නොදන්නා බව මෙන්ම ඒ පුවත්පත් එහි ආරක්ෂාව අපේක්ෂා නොකරන බවද එයින් පෙනී යයි. සැකය දුරලීම සඳහා අපි ඒ බව මෙහි සඳහන් කළ යුත්තෙමු. පුවත්පත් පැමිණිලි කොමිසම පොලිස්කාරයකුට වඩා සමගිය ඇති කිරීමට අවශ්‍ය අවසාන තීරණ ගැනීමේ බලතල හිමි සමගිදායකයෙකි. එහි අරමුණ, රාජ්‍ය අත පෙවීම් හෝ අධික වියදම් සහිත දීර්ඝ කාලීන හා බොහෝ විට එදිරිවාදී අධිකරණ ක්‍රියාවලී වෙනුවට විකල්ප වැඩපිළිවෙළක යෙදීමය.

එස් වුවද, පුවත්පත් පැමිණිලි කොමිසම පවා ඒ බව හැමවිටම දන්නා බවක් නොපෙනේ. පුවත්පත්වලින් දැක්වෙන අඩු මට්ටමේ සහයෝගය කෙරෙහි පැමිණිලි නිලධාරින්ගේ ප්‍රතිචාරයෙන් ඇඟවුණේ ආචාර ධර්ම පද්ධතිය වඩාත් දැඩි හා වඩාත් විස්තරාත්මක, අවශ්‍යයෙන්ම කතුවරුනට කරුණු ඒත්තු ගැන්නීමට වඩා ඔවුනට දඬුවම් දීමේ කාර්ය පද්ධතියක්.විය යුතු බවයි. එයින් දැක්වෙන්නේ මේ ක්‍රියාදාමයේ අර්ථවල සියුම් වෙනස්කම් පිළිබඳ අනවබෝධයයි. තමන් මේ කාර්ය පද්ධතියෙන් බැහැර ලා ඇතැයි සාමාන්‍ය පුවත්පත් කලාවේදීනට හැඟෙන බවත් ඒ සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කර නැති බව මෙන්ම ඒ ගැන ඔවුන්ගේ අදහස් විමසා නැති බවත් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා සංගම්ද ප්‍රකාශ කරන හෙයින් ගැටලුව වඩාත් ව්‍යාකූල වී තිබේ. එපමණක් නොව ඇතැම් කර්තෘවරුන් ඔවුන්ගේම ආචාර ධර්ම මාලාව නොරිස්සුම් සහගතව නොසලකා හරින බවටත් එය නොසලකා හරින ලෙස ඔවුන් ඔවුන්ගේ කාර්ය මණ්ඩල පවා දිරිගන්වන බවටත් යථෝක්ත සංවිධාන චෝදනා කරයි. ප්‍රකට පෞද්ගලික අපේක්ෂාද ප්‍රබල අන්දමින් දේශපාලනීකරණය වුණු පෞද්ගලික මත ඉදිරිපත් කරන පුද්ගලයන්ද පිළිබඳ පැහැදිලි අවදානමක් මෙහි ඇත්තේය. පොදු ජන හදවත් දිනා ගැනීම පදනම් කොටගත් මේ කාර්ය පද්ධතිය තුළ ඇති වී තිබෙන භේද භින්නතා සහ වියවුල්ද නිසා මෙහි සාර්ථකත්වය සඳහා නැතිවම බැරි පොදු ජන විශ්වාසය දිනා ගැනීමට ඇති ඉඩකඩ අතිශයින්ම අල්ප වී තිබේ.

## 3. විසඳුම් කවරේද?

කලින්ද සඳහක් කළ පරිදි ඒ සියලු කරුණුවලින් අනතුරක් ඇඟැවෙන නමුත් මහත් බියට පත්වීමට තවමත් අවශ්‍යයෙන්ම කරුණු යෙදී නැත්තේය. පුවත්පතින් තමන්ට වරදක් සිදු වී ඇතැයි හැඟෙන පුද්ගලයන්ට සහන සැලැසීම සඳහා සමගිය ඇති කිරීමට ස්වාධීනව ක්‍රියාත්මක වන එහෙත් නෛතික නොවන පියවර ගන්නා ස්වයං නියාමන පාලනාධිකාරයක් පිළිබඳ, සාපේක්ෂ වශයෙන් නව සංකල්පයක අභිවෘද්ධිය එක් රැයකින් සිදු නොවේ. එය විවරණය වීම අත්‍යවශ්‍යය. යථාවබෝධය හැමවිටම යථාර්ථයම වන අතර ප්‍රචලිතව ඇති වැරදි අවබෝධය නිවැරදි කළ යුතුය. යම් ආකාරයක සංස්කෘතික වෙනසක්ද අවශ්‍ය වනු ඇත. පැරැණි රාජ්‍ය ක්‍රියාවලියෙහිදී මෙන් නොව මෙහිදී ජනතාව නියෝගයෙන් හා චාටුවෙන් අවනත කර නොගෙන කරුණු ඒත්තු ගැන්නීමෙන් නම්මා ගත යුතුය. මෙය ජනතා සිත් සතන් දිනා ගැනීමේ ප්‍රයත්නයක් වන අතරම ස්වයං නියාමනය යනු කුමක්ද යන වග හා එය ඔවුන් වෙනුවෙන් කටයුතු කරන්නේ කෙසේද යන වග නොදන්නා ඉතා විශාල පිරිසක් සිටින අතර ඔවුන් පුවත්පත්වලට එරෙහි දුක් ගැනිවිලි සහිත පැමිණිලිකරුවන්ද කතුවරුන්ද පුවත්පත් කලාවේදීන්ද යන්න අනුව ඒ නොදැනුමෙහි වෙනසක් නොවේ. ගත වූ වසර හතර තුළ වැඩි ප්‍රගතියක් ලද හැකිව තිබුණි. සපුරා ගත යුතුව ඇති අඩුපාඩු බොහෝය.

පුවත්පත් කර්මාන්තය මෙන්ම පුවත්පත් පැමිණිලි කොමිසමද වෙන් වශයෙන් හා ඒකාබද්ධව හදිසි පියවර ගැනීමේ අවශ්‍යතාවක් ඇත්තේය. එහි කේන්ද්‍රස්ථානයෙහි අධ්‍යාපන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක විය යුතුය.

★ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ස්වයං නියාමනයේ සැබෑ මෙහෙවර විස්තර කිරීම, පොදු ජනතාවට එය උපකාරී වන ආකාරයත් පුවත්පතට එයින් ආරක්ෂාව සැලසෙන ආකාරය මෙන්ම එය යහපාලනයක සංකේතයක් බවත් පැහැදිලි කිරීම.

★ අසාර්ථකත්වයේ විපාක. පුවත්පත රාජ්‍ය පාලනයට නතු වීමේත් අධිකරණය ඉදිරියේ දීර්ඝ කාලීන වියදම් අධික නඩු හබ හා වැඩි වැඩියෙන් දඩ මුදල් නියම වීමේ අවදානමත් ඊට විකල්ප වශයෙන් පාඨකයාට පහසුවෙන් පිවිසිය හැකි වියදම් අඩු ක්‍රියාමාර්ගයෙන් ඔහු බැහැර කිරීමේ අවදානමත් පැහැදිලි කිරීම.

★ ස්වයං නියාමන ක්‍රියාදාමය සඳහා සිය මුදලෙන් පවා ආධාර දුන් පිරිසක්ද සිටියදී සාර්ථකත්වය සඳහා ප්‍රකාශකයන්ගේ හා කතුවරුන්ගේ කැප වීම අතින් දක්නට ලැබෙන අතපසුවීමක් වුවද ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රමිතියට හානිදායක වන ආකාරය විදහා දැක්වීම.

මේ පණිවුඩ සෑම තලයකටම නිකුත් විය යුතුය. එවිට,

1. **කර්මාන්තය තුළම** . මුරණ්ඩු හා බුද්ධිගෝචර නොවන බලපෑම්වලට එරෙහිව සටන් කොට එක්සත් භාවයත් සහයෝගිතාවත් පිළිබඳ සාම්‍යයක් නිර්මාණය කර ගත හැකි වන්නේය. මෙය ප්‍රකාශකයන්ගේ පටන් කතුවරුන් ඔස්සේ ඉහළ සිට පහළට ක්‍රියාත්මත විය යුතුය. කණ්ඩායම් ආධිපත්‍යය පිළිබඳ චෝදනාවලට එරෙහිව සටන් කරනු සඳහා මේ අවස්ථාවේදී මෙම ක්‍රියාවලිය වඩාත් පුළුල් කිරීම හරවත් වනු ඇත. ප්‍රවෘත්ති අංශයෙහි හෝ ප්‍රතිවාදී කතුවරුන් අතර හෝ " ඔවුන් හා අප "සංස්කෘතියක් ඇති වීම විනාශකාරී විය හැකිය. ඒ අරමුණ ඉටුකර ගැනීමත් ආචාර ධර්ම මාලාව හා එය කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය වඩාත් විස්තරාත්මක තත්ත්වයට පත් කිරීමත් සඳහා යොදා ගත හැකි මාර්ග පිළිබඳ විශේෂ නිර්දේශ මෙහි පහත සඳහන් "ඒ" ඇමුණුමෙහි දැක්වෙයි.

2. **ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම තුළ** - සිදු වී ඇති කාර්ය මණ්ඩල වෙනස්කම් නිසා මුල් ස්වයං නියාමන සංස්කෘතිය,අධිකරණ ක්‍රියාවලියකට වඩා සමගිය තහවුරු කරන සේවයක් වශයෙන් .මුල් බැස ගෙන නැත්තේය. කොමිසම කිසියම් ආකාරයක පොලිස් මානසිකත්වයක් සහිත ආයතනයක් විය යුතුය යනුවෙන් හැඟීමක් පවත්නේ නම් එය සහමුලින්ම පරමාර්ථයෙන් බැහැරය. එහෙයින් එම මතය අධෛර්යවත් කළ යුතුය. කොමිසම ශක්තිමත්, ස්වාධීන බේරුම්කරුවෙකි.තවද, පුවත්පතේ ස්වාභාවික සතුරෙක් නොව මිත්‍රශීලී විවේචකයෙකි. විශේෂ නිර්දේශ සඳහා "ඒ" ඇමුණුම බලන්න.

3. **පුළුල් පොදු ජනතාවට හා සිවිල් සමාජයට** - පුවත්පත් පැමිණිලි කොමිසමේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ප්‍රධාන කාර්ය භාරයය එයයි. ජනතා විශ්වාසය ගොඩනැගෙන පරිදි ක්‍රියාත්මක වීම සඳහා ඔවුහු නැවත පුහුණුව ලැබිය යුත්තෝය. පොදු ජන සම්බන්ධතා ක්‍රියාකාරිත්වය සාර්ථක විය හැක්කේ තමන් කවුරුන්ද තමන් හා පුවත්පත් පැමිණිලි කොමිසම කළ යුත්තේ කුමක්ද යන වග ඒ කාර්ය මණ්ඩල සාමාජිකයෝ අවබෝධ කර ගන්නේ නම් පමණකි. නිතර අසනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු ඇතුළත් අධ්‍යාපනික ලේඛන ප්‍රකාශයට පත් කිරීමත් (ආදර්ශ ප්‍රශ්න " සී" ඇමුණුමෙහි සවිස්තරව දැක්වෙයි) පුළුල් සමාජය මුණගැහෙන මාර්ග සකසා ගැනීමත් මගින් අවබෝධතා ගොඩ නැඟීමේ ප්‍රචාරයක යෙදෙන්නට කාර්ය මණ්ඩල සාමාජිකයනට හැකි වන්නේය.

**කාලසටහන**. ඉතා පුළුල් වශයෙන්ම ස්වයං නිර්ණායක කාර්යයකි. කාර්ය මණ්ඩලය නැවත පුහුණු කිරීමත් පොදු ජනතාව දැනුවත් කිරීම හා පුවත්පත් කර්මාන්තය තුළ අධ්‍යාපනික ක්‍රියාවලියකට මුල පිරීමත් සමගාමීව ඉදිරියට ගෙනයාමේ අවශ්‍යතාවයක් පවත්නා අතර එය ආචාර ධර්ම මාලාවේ සමාලෝචන ක්‍රියාවලියට ද සම්බන්ධ වීම අවශ්‍යය. මේ සඳහා යම් කාලයක් ගත වනු ඇත.

කෙසේ වුවද, කටයුතු කඩිනම් කරනු පිණිස උපයෝගි කර ගත හැකි න්‍යාය පත්‍රය මේ අරමුණු කෙරෙහි යොමු කිරීම යෝග්‍යය.

★ ආචාර ධර්ම කමිටුව වඩාත් පුළුල් කරනු පිණිස ඉක්මනින් එය ප්‍රතිසංස්කරණය කිරීමටත් ආචාර ධර්ම පද්ධතියේ පළමුවැනි පුළුල් සමාලෝචනයේදී එය කෙසේ ප්‍රතිශෝධනය විය යුතුද යන්න

ගැන පොදු ජනතාවගෙන් හා පුවත්පත් ක්ෂේත්‍රයෙන්ද අදහස් විමසීමටත් කර්තෘ සංසදය ගන්නා පියවර.

★ ඒ සමඟම පොදු ජනතාව දැනුවත් කිරීමේ ස්වකීය ප්‍රචාරක වැඩපිළිවෙළ වහාම ආරම්භ කිරීමේ සූදානමක් වශයෙන් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම එහි මහා මණ්ඩලය යථා තත්ත්වයට පත් කර ගත යුතුය.

★ ආචාර ධර්ම මාලාවේ වෙනස්කම්, පොදු ජන අදහස්වල ප්‍රතිලාභයද ඇතිව ප්‍රචාරක වැඩ පිළිවෙළේ කාලීන වෙනස්කම්වලටද ඉඩ සලසමින් හා පොදු ජනතා ඇසටද එය යොමු වන ආකාරයෙන් යථා කාලයේදී සිදුවිය යුතුය.

**<u>ඇමුණුම්</u>**

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේත් කර්තෘ සංසදයේ ආචාර ධර්ම සමාලෝචන වැඩපිළිවෙළේත් වෙනස්කම් සඳහා විශේෂ නිර්දේශ පහත සඳහන් ඇමුණුම්වල විස්තර සහිතව දැක්වෙයි. කළ හැකි වෙනස්කම් අචාර ධර්ම කමිටුව විසින් සලකා බැලෙනු ඇත. නිතර අසනු ලබන්නා වූද පුවත්පත් ක්ෂේත්‍රයේ බොහෝ සාමාජිකයනටත් පුළුල් වශයෙන් සිවිල් සමාජයටත් වැදගත් වන්නා වූද ප්‍රශ්න සඳහා පිළිතුරුද ඇමුණුම්වල ඇතුළත් වෙයි.
අයි.එම්.බී. 07.11.07

**"ඒ" ඇමුණුම**

**<u>ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමත් කර්තෘ සංසදයත් සඳහා විශේෂ නිර්දේශ</u>**

1. **ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ලේකම් කාර්යාලය** : මෙම ලේකම් කාර්යාලයෙහි අධිකාරී බලයක් හා විශ්වාසනීය නායකත්වයක් නැත. අවුරුදු හතරකට කලින් ස්වයං නියාමන ක්‍රියාදාමය ආරම්භ වීමෙන් පසු කාර්ය මණ්ඩලයෙහි සිදු වූ වෙනස, ඒ ඌනතාවට තුඩු දුන් හේතුවල කොටසක් විය හැකිය. මුලින් පැවැති විශ්වසනීයත්වය ඒ ආකාරයෙන්ම පවත්වාගෙනගොස් නැතිව පමණක් නොව අන්‍යොන්‍ය සහයෝගිතාවක් නැතිකම පුවත්පත් ක්ෂේත්‍රයේ අත්දැකීම බවට පත්ව කොමිසමේ කාර්ය මණ්ඩල සාමාජිකයන් හා ඇතැම් කර්තෘවරුන් අතර පුළුල් භේදයක් හටගෙන තිබේ. සම්බන්ධතා අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවක් පවත්නේය.

- ★ අධ්‍යක්ෂවරයාටත් කාර්ය මණ්ඩලයටත්(පෙනෙන හැටියට නම්, කොමසාරිස්වරුනට පවා) මුල් අරමුණු සිහිපත් කරවීමේ අවශ්‍යතාවක් තිබේ.
- ★ විශ්වාසයෙන් යුතුව පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකිවන සේ පොදු ජනතා විශ්වාසය දිනා ගැනීම පිණිස ඔවුන් දැනුවත් කිරීමේ වර්තමාන වැඩපිළිවෙළ ප්‍රචාරක දැන්වීම් හා පුවත්පත් නිවේදනවල හා මහජන රැස්වීම්වලද සහාය ඇතිව අරමුණු සහගතව වර්ධනය කළ යුතුය. මේ මූලික වැඩපිළිවෙළ මීට විරුද්ධ කර්තෘවරුන් දිනාගැනීමේ සමාන්තර ක්‍රියා දාමයකට සම්බන්ධ විය යුතුය. එහි අරමුණ විය යුත්තේ ස්වයං නියාමන සංස්කෘතිය පිළිබඳ දැනුවත්භාවයක් ඔවුන් තුළ යළිත් ඇති කිරීමත් එහි ප්‍රතිලාභ ඔවුනට පහදා දීම හා ආචාර ධර්ම මාලාව තර්ජනයක් සේ නොසලකා එය අනුගමනය කිරීම සඳහා ඔවුනට උපකාරී වීමත්ය. එය අදියර දෙකකින් ක්‍රියාත්මක කළ යුතුය.
- ★ පළමුවැන්න, ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් උපකාර හා මාර්ගෝපදේශ ලබා ගැනීමට එක් එක් කර්තෘවරයා පෞද්ගලික මට්ටමෙන් දිරි ගැන්විය හැකි අවස්ථාවලදී අනියම් මට්ටමෙන් එසේ කිරීම.
- ★ දෙවැන්න නම් ශ්‍රී ලංකා කර්තෘ සංසදය හා එවැනි වෙනත් සංවිධාන හමු වී වඩාත් විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම. යළිදු එහි අරමුණ විය යුත්තේ, පුවත්පත් පැමිණිලි කොමිසමේ සාර්ථකත්වයෙන් ලැබිය හැකි අන්‍යොන්‍ය වාසි ඇති බව ඔවුනට ඒත්තු ගැන්වීමෙන් ඒ කෙරෙහි ඔවුන් තුළ විශ්වාසය තහවුරු කිරීමයි.

2. **කර්තෘ සංසදය** : ස්වයං නියාමන ක්‍රියාවලිය ආරම්භ කිරීමත් වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය සම්පාදනය කිරීමත් සඳහා ශ්‍රී ලංකා කර්තෘ සංසදය ඉතා වැදගත් මෙහෙවරක් ඉටු කෙළේය. එසේ වුවද, ඒ පිළිබඳ අවශ්‍ය පාලනය අවශ්‍ය මට්ටමෙන් පවත්වා ගෙන යෑම විවිධ හේතු නිසා සංසදයට දුෂ්කර කාර්යයක් වී ඇත. එහි ප්‍රතිවිපාක දෙකක් දක්නට ලැබේ. ආචාර ධර්ම පද්ධතිය

වාර්ෂිකව සමාලෝචනයට භාජන වීමේ අවශ්‍යතාව ඉෂ්ට නොවීම නිසා එම ක්‍රියාවලිය බිඳ වැටීම ඉන් එකකි. කුමන හේතු නිසා හෝ සංසදයේ සාමාජිකයන් බවට පත් නොවුණු කර්තෘවරුන්ගේ විරෝධතාවලට එම ක්‍රියාවලිය ඉලක්ක වීම දෙවැන්නය. ශ්‍රී ලංකාවේ කර්තෘවරුන් සියයට සියයක්ම ඒකරාශී කර ගන්නට සංසදයට නොහැකිව තිබියදී එහි තනි භාරකාරත්වයෙහි ආචාර ධර්ම පද්ධතිය පැවැතීම අනතුරුදායකය. එහෙයින් කර්තෘ සංසදය මෙම කරුණු සැලකිල්ලට භාජන කළ යුතුය.

- ★ සංසද සාමාජිකයන්ගෙන් හා සමාජිකයන් නොවන්නන්ගෙන් සමන්විත ස්වාධීන පදනමක් සහිත කර්තෘවරුන්ගේ ආචාර ධර්ම කමිටුවක් වෙනම පිහිටුවීම, වැඩි නියෝජනයකින් හා දූරදර්ශී භාවයකින් යුත් මෙවැනි කමිටුවක් වඩාත් සාධාරණ බව පෙනෙනු ඇත. සංසද සාමාජිකයන් හා බාහිර සාමාජිකයන් අතර පවත්නා හිදැස යා කිරීමේ මඟක්ද එයින් දීර්ඝ කාලීන වශයෙන් හෙළි පෙහෙළි වනවා ඇත.

- ★ වැඩිදුර ප්‍රතිසංස්කරණ කාර්යයක් වශයෙන් ප්‍රමුඛ පෙළේ පුවත්පත් කලාවේදී සංවිධානවලින් තෝරා ගැනුණු ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ටද ආචාර ධර්ම කමිටුවේ සාමාජිකත්වය සඳහා ආරාධනය කිරීමෙන්, ස්වයං නියාමනය සඳහා වඩාත් පුළුල් දායකත්වයකට මඟ සැලැසෙනු ඇත.

- ★ ආචාර ධර්ම පද්ධතිය හා ස්වයං නියාමනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කාර්යාල ස්ථානයන්හි සම්මන්ත්‍රණ විධිමත්ව සංවිධානය කරනු පිණිස ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සමඟ එක්ව කටයුතු කිරීම.

ඇමුණුම අංක - 02

# කර්තෘ සංසදයේ වෘත්තීය ආචාර ධර්ම සමාලෝචන කමිටු වාර්තාව

**පසුබිම**

2002/03 වසරවලදී හෝ ඊට ආසන්න කාලයකදී ශ්‍රී ලංකා කර්තෘ සංසද සාමාජිකයෝ 'පුවත්පත් කලාවේදීන්ගේ ආචාර ධර්ම පද්ධතිය' යනුවෙන්ද හැඳින්වුණු වෘත්තීය ආචාර ධර්ම මාලාව ඒකච්ඡන්දයෙන් සම්මත කළහ.

ඒ වන විටද වෙනත් ආචාර ධර්ම මාලාවක් තිබුණු නමුත් ඒ බව දැනගෙන සිටියේ සුළු පිරිසකි. එය ක්‍රියාත්මක කළේ ඊටත් වඩා සුළු පිරිසකි. එය, 1980 ගණන්වල මුල් භාගයේදී ව්‍යවස්ථාගත පුවත්පත් මණ්ඩලය විසින් කෙටුම්පත් කරනු ලැබ පුවත්පත් මණ්ඩල නීතිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආචාර ධර්ම පද්ධතියයි. කවදාවත් ප්‍රායෝගික තත්ත්වයට පත් නොවුණු තරම්යැයි කිව හැකි නමුත් එය සැබැවින්ම රටේ නීතිය බවට පත්ව තිබුණි.

පුවත්පත් මණ්ඩලයේ ආචාර ධර්ම පද්ධතියත් පුවත්පත් කලාවේදීන් සඳහා වන විවිධ විදේශීය ආචාර ධර්ම පද්ධති මෙන්ම ශ්‍රී ලංකාවෙහි පවත්නා මාධ්‍ය සංස්කෘතියද සැලැකිල්ලට ගනිමින් කර්තෘ සංසදය ආචාර ධර්ම මාලාවක් කෙටුම්පත් කළේය. 1998 මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශනයෙහි දැක්වුණු මූලධර්මද කර්තෘ සංසද ආචාර ධර්ම පද්ධතියට පදනම් වූවේය.

අහෝසි කරන ලද සාපරාධ අපහාස නීති වෙනුවට ස්වයං නියාමන යාන්ත්‍රණයකින් ක්‍රියාත්මක වන උපදෙස් මාලාවක් පනවා ගන්නා ලෙස දේශපාලකයන් හා පොදු ජනතාව පුවත්පත් කලාවේදීන්ගෙන් කළ ඉල්ලීමට පිළිතුරු වශයෙන් සහ කොළඹ ප්‍රකාශනයේ අත්සන්කරුවන් දුන් ප්‍රතිඥාවක ප්‍රතිඵලයක් වශයෙන් කර්තෘ සංසද ආචාර ධර්ම පද්ධතිය එළි දැක්කේය.

පාර්ලිමේන්තුව 2002 දී සාපරාධී අපහාස නීති ඒකච්ඡන්දයෙන් අහෝසි කළ අතර ශ්‍රී ලංකා කර්තෘ සංසදය ආචාර ධර්ම පද්ධතිය පැනැවීමෙන් 'ගිවිසුමේ' ඊට අයත් කොටස ඉටු කෙළේය. අලුතෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය ඒ ආචාර ධර්ම පද්ධතිය ක්‍රියාත්මක කරනු පිණිස පුවත්පත් පැමිණිලි කොමිසම පිහිටුවූයේය.

කර්තෘ සංසද ආචාර ධර්ම පද්ධතිය බිහිවීමත් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම ස්ථාපනය වීමත් හේතුවෙන් සංස්ථාපිත පුවත්පත් මණ්ඩල නීතිය යටතේ වූ ආචාර ධර්ම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව අහෝසි විය. එනිසාම, පුවත්පත් මණ්ඩලයද 2002 පටන් අක්‍රීය වූයේය.

**වර්තමාන තත්ත්වය ඃ**

ආචාර ධර්ම පද්ධතියේ වාර්ෂික සමාලෝචනය සඳහා කර්තෘ සංසද ආචාර ධර්ම පද්ධතියෙන් ඉඩ සැලැසෙයි. එය සමාලෝචනයක් විනා අනිවාර්ය ප්‍රතිශෝධනයක් නොවන බවද මෙහිලා සඳහන් කළ යුතුව තිබේ. එසේ වුවද, කර්තෘ සංසදය 2002 න් පසු ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ නිසි සමාලෝචනයක් සිදු කොට නැති බවද වරද පිළිගැනීමක් වශයෙන් කිව යුතුය. 2005 දී කර්තෘ සංසදය, ජාත්‍යන්තර අධිකරණයේ විශ්‍රාමික උපසභාපති හා පුවත්පත් නිදහස පිළිබඳ සුප්‍රකට ලේඛකයකුද වන විනිසුරු ක්‍රිස්ටෝපර් වීරමන්ත්‍රී මහතාගේ ප්‍රධානත්වයෙන් ආචාර ධර්ම සමාලෝචන කමිටුවක් පත් කෙළේය. සිවිල් සමාජයේත් පුවත්පත් ක්ෂේත්‍රයේත් ප්‍රමුඛ පෙළේ පුද්ගලයන් කීප දෙනකුගෙන්ද එම කමිටුව සමන්විත විය. ආචාර ධර්ම පද්ධතියෙහි කිසියම් ප්‍රතිශෝධනයක් සිදුවීම

අවශ්‍යයැයි හැඟේ නම් ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වරමද එම කමිටුවට හිමිව තිබුණි.

ආචාර ධර්ම කමිටුව රැස්ව අදහස් හුවමාරු කර ගත්හ. එහෙත් අවුරුදු දෙකකට ආසන්න කාලයක් තුළ කිසිදු නිර්දේශයක් එම කමිටුවෙන් කර්තෘ සංසදය වෙත ඉදිරිපත් නොවුණි. නිර්දේශ ඉදිරිපත් කරනු පිණිස සමාන්තර ආචාර ධර්ම සමාලෝචන කමිටුවක් පත් කරන ලෙස කර්තෘ සංසදය 2007 දී පුවත්පත් පැමිණිලි කොමිසමෙන් ඉල්ලා සිටි අතර කොමිසම ඒ සඳහා ක්‍රියාත්මක විය. සමාන්තර කමිටුවට සිය නිර්දේශ ඉදිරිපත් කරන ලෙස මහජනතාවට ඇරියුම් කැරිණි. වාර්තාවක් ඉදිරිපත් කිරීමට තමාට හැකියාවක් නොමැතිබව විනිසුරු වීරමන්ත්‍රී පුවත්පත් පැමිණිලි කොමිසමට දැන්වීය.

ආචාර ධර්ම මාලාවෙහි යම් ප්‍රතිශෝධනයක් අවශ්‍ය නම් එසේ කිරීමේ බලාපොරොත්තුව ඇතිව, නිර්දේශ අධ්‍යනය කොට තමන් වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු පිණිස කර්තෘ සංසදයද ඒ කාලය තුළම සිය සාමාජිකයන්ගෙන්ම සමන්විත ආචාර ධර්ම සමාලෝචන කමිටුවක් පත් කෙළේය. ඒ අනුව කර්තෘ සංසද ආචාර ධර්ම සමාලෝචන කමිටුව ගත් එක් පියවරක් වූයේ, එහි කටයුතුවලට සහාය වීම සඳහා එක්සත් රාජධානියේ කර්තෘවරුන්ගේ ආචාර ධර්ම කමිටුවේ ලේකම් ඉයන් බීල්ස් මහතාට ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස ආරාධනා කරන්නැයි ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයෙන් ඉල්ලා සිටීමය. බීල්ස් මහතා ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ දැනුමක් ඇත්තකු මෙන්ම ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පිහිටුවීමෙහිලා එහි මුල් අදියරවලදී විශේෂයෙන්ම පොදු රාජ්‍ය මණ්ඩල පුවත්පත් සංගමයේද අනුග්‍රහය ඇතිව උපකාරී වූවන් අතර වැදගත් තැනක් ගත් පුද්ගලයෙක් ද විය.

2007 ඔක්තෝබර 16 වැනිදා කොළඹට පැමිණි බීල්ස් මහතා මෙරට ගතකළ සතියක කාලය තුළ, ආචාර ධර්ම සමාලෝචන කමිටුවත් පුවත්පත් පැමිණිලි කොමිසමේ,ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සභාපතිවරයා සහ සාමාජිකයනුත් පුවත්පත් පැමිණිලි කොමිසමේ ලේකම් මණ්ඩලයත් වෘත්තීය පත්‍රකලාවේදීන් ගේ සංගමය ඇතුළු මාධ්‍ය සංවිධාන කිහිපයක ප්‍රධානීන් මුණ ගැසුණේය.

බීල්ස් මහතා සහ කර්තෘ සංසද ආචාර ධර්ම සමාලෝචන කමිටුව අතරත් ප්‍රයෝජනවත් සාකච්ඡා පැවැත්විණි. බීල්ස් මහතා පෙරළා එක්සත් රාජධානිය බලා යද්දී කමිටුවේ ඉල්ලීම අනුව ඔහුගේ නිර්දේශ අප වෙත ලැබීමට සැලැස්විය. එම වාර්තාව ආචාර ධර්ම සමාලෝචන කමිටුවේ පරීක්ෂාකාරී සැලකිල්ලට ලක් කරනු පිණිසත් සංසද ආචාර ධර්ම මාලාවේ සංශෝධන වශයෙන් අනුමත කර ගැනීම සඳහාත් පහත දැක්වෙන නිර්දේශ සංසද සාමාජිකත්වය වෙත ඉදිරිපත් කිරීමට කමිටු සාමාජිකයෝ කැමැත්තෝය.

<u>ආචාර ධර්ම මාලාවෙහි කළ හැකි වෙනස්කම් පිළිබඳ නිර්දේශ</u>

ආචාර ධර්ම පද්ධතිය වාර්ෂිකව සමාලෝචනය නොවීම කනගාටුදායක කරුණක් වුවද එය ව්‍යසනයක් නොවේ. සමාලෝචන අවශ්‍යතාව යන්නෙන් අදහස් කැරෙන්නේ ඉබේ සිදුවන වෙනස්කම් නොවේ.සම්පූර්ණ කළයුතු හිදැසක් ඇති බවට දැක්වෙන විශේෂ සාක්ෂි මත පමණක් ප්‍රතිශෝධන සිදු විය යුතුය. පමණට වැඩි වෙනස්කම් නිසා නිරන්තර අවුල් හටගනී. තීරණ ගැනීමේ ශක්තිය නැති බව ප්‍රකට වෙයි. එහි ප්‍රතිඵලය වන්නේ එකඟතාවක් ඇති නොවීමයි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමෙන් ඉදිරිපත් වූ අදහස්වලින් පැවසෙන්නේ දණ්ඩනකාරී අරමුණකි. පුවත්පත් පැමිණිලි කොමිසමේ පූර්ව යෝජනා, <u>අතවනන</u> කර්තෘවරුනට පාඩමක් උගැන්වීම සඳහා තත්ත්වය වඩාත් දැඩි කිරීම පිණිස සැකසී ඇති බව පෙනී යයි. එය හරිමඟ නොවේයැයි අපි අදහස් කළෙමු. ආචාර ධර්ම මාලාව දැනටමත් දැඩිය. එය ක්‍රියාත්මක නොකැරෙන්නේ නම් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම බලහත්කාරය නොව කරුණු ඒත්තු ගැන්වීමේ මඟට පිවිසිය යුතුය.

ආචාර ධර්ම පද්ධතියෙහි කළ හැකි වෙනස්කම් වශයෙන් මෙම කරුණු සලකා බැලීම මැනවි:

1. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සමඟ සහයෝගිතාව අවශ්‍ය බව ප්‍රකාශ කරන වගන්තියක් පූර්විකාවට ඇතුළත් කරන්න. එක්සත් රාජධානියේ ආචාර ධර්ම පද්ධතියෙහි ඇතුළත් එවැනි ඡේදයකින් මෙසේ කියැවෙයි: 'පැමිණිලි විසඳීමේදී කර්තෘවරු පුවත්පත් පැමිණිලි කොමිසම සමඟ ක්ෂණිකව සහයෝගයෙන් කටයුතු කළ යුතුව ඇත, ආචාර ධර්ම කඩකර ඇති බවට තීන්දු කරනු ලබන හැම ප්‍රකාශනයක්ම එම තීන්දුව, නිසි ප්‍රමුඛත්වයක් හා පුවත්පත් පැමිණිලි කොමිසම ගැන සඳහනක් සහිත සිරස්තලයක්ද සහිතව සම්පූර්ණයෙන්ම පළ කළ යුත්තේය'. එම ආචාර ධර්මවලින් බොහෝමයක් දැනටමත් ශ්‍රී ලංකාවේ කර්තෘවරුන්ගේ සදාචාරාත්මක බැඳීම් වශයෙන් පවත්නා නමුත් එය රීතිගතව නොමැත.

1. එම ඉංග්‍රීසි පෙළෙහි ඇතුළත් 'ජාත්‍යන්තර පුවත්පත් කලාවේ උසස්තම ප්‍රමිති පවත්වා ගන්නා අතරම' යන කොටසේ 'ජාත්‍යන්තර'යන සඳහන ඉවත් කරන්න. ජාත්‍යන්තර පුවත්පත් කලාවේ ප්‍රායෝගිකතාව කෙරෙහි යම් අවධානයක් දැක්වෙන අතරම අප අපගේම උසස් ප්‍රමිතිය පවත්වා ගන්නේ නම්, එවැනි සඳහනක් නැතිවම අපගේ අරමුණ සපුරා ගත හැකිය. කෙසේ හෝ සිංහල පෙළෙහි එම සඳහන නොමැත.

2. ශ්‍රී ලංකාවෙහි තරමක බරපතළ ප්‍රශ්නයක්ව පවත්නා සිය දිවිනසාගැනීම් පිළිබඳ වාර්තා කිරීම කෙරෙහි සීමාවක් පනවන වගන්තියක් ඇතුළත් කරන්න. එක්සත් රාජධානියේ ආචාර ධර්ම පද්ධතිය මෙසේ කියැවෙන පරිදි මෑතදී සංශෝධනය කැරුණු බව උදාහරණයක් වශයෙන් සඳහන් කරමු. "සිය දිවිනසා ගැනීමක් වාර්තා කිරීමේදී එම ජීවිත විනාශය සඳහා යොදා ගැනුණු උපක්‍රමය පිළිබඳ කරුණු පමණ ඉක්මවා ඉදිරිපත් නොකිරීමට පුවත්පත් කලාවේදීයා පරෙස්සම් විය යුතුය"

3. පරිගණක ප්‍රකාශන මෙන්ම මුද්‍රිත ප්‍රකාශනවලටත් ප්‍රකාශනවල පරිවර්තන හා අනුකරණ කෙරෙහිත් මෙම ආචාර ධර්ම පද්ධතිය සදාචාරාත්මක වශයෙන් වැඩිපුර බලපාන බව පැහැදිලි කරන්න.

4. විශේෂයෙන්ම දේශීය භාෂාවලින් පළවන පුවත්පත්හි **චිත්‍රක** වාර්තාකරණය හා පින්තූර පාලනය කළ හැකි වන ආචාර ධර්ම පද්ධතිය විස්තාරණය විය යුතුයැයි යෝජනා ඉදිරිපත් වී තිබේ. එසේ වුවද එය දුෂ්කර කාර්යයක් වන අතරම, නිසි සංවේදිතාවෙන් හා ස්ථානෝචිත ප්‍රඥාවෙන්ද යුක්තව පොදු ජන සුබ සිද්ධිය පිළිබඳ සිය වගකීමට යටත්ව තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පුවත්පත්වලට පැවැරෙන බැඳීම ප්‍රකාශ කරන වර්තමාන 6.1 වගන්තියෙන් ආවරණය වන බවක්ද පෙනේ.

5. දෙමළ ත්‍රස්තවාදී කණ්ඩායම්වල ප්‍රචණ්ඩ ක්‍රියා වැඩිවෙද්දී පුවත්පත් මඟින් දෙමළ ජනතාව හෙළා දකින අවස්ථාද වැඩිව ඇති බවට සිතන්නට හේතු ඇතැයි දෙමළ පුවත්පත් පෙන්වා දී ඇති අතර ඒ කාරණය සැලැකිල්ලටද භාජන වී තිබේ. කෙසේ වුවද "දැන දැනම හෝ හිතාමතා හෝ ජනවාර්ගික හෝ ආගමික භේද හා ප්‍රචණ්ඩත්වයට අනුබල දීම තහනම් කරන 6.3 වගන්තියෙන් ඒ කාරණයද ආවරණය වන බව පෙනේ. එමෙන්ම නමින් දැක්වෙන පුද්ගලයන්ගේ ජාතිය හෝ ආගම අවමානාත්මකව හෝ අදාළ නොවන සේ සඳහන් කිරීම 6.4i හා 6.4 ii වගන්තිවලින් තහනම් වෙයි. ආචාර ධර්ම පද්ධතිය සියලුම ජන වර්ගවලට එක සේ අදාළ වන හෙයින් එය වරණාත්මකව යොදා ගත හැකි නොවේ. එහි වෙනසක් සිදු කිරීමේදී ඒ කාරණය සැලකිල්ලට ගත යුතුය.

6. ආචාර ධර්ම පද්ධතියේ දීර්ඝත්වය පිළිබඳ ප්‍රශ්නයද සැලැකිල්ලට භාජන වීම යෝග්‍යය. එය දිග වැඩියැයි කියන ඇතැම් විවේචකයෝ ජාත්‍යන්තර පුවත්පත් කලාවේදී සංවිධානයේ ආචාර ධර්ම පද්ධතියේ ලුහුඬු පොදු මූලධර්ම කෙරෙහි වැඩි කැමැත්තක් දක්වති. ආචාර ධර්ම පද්ධතිය වඩාත් විස්තරාත්මක වනු පිණිස එය විස්තාරණය කළ යුතුයැයි තවත් පිරිසක් කියති. එයින් එය වඩාත් දීර්ඝ වනු ඇත. ජාත්‍යන්තර පුවත්පත් කලාවේදී සංවිධානයේ ලේඛනය, බලපෑමෙන් පුළුල්, ප්‍රායෝගික කරුණුවලට වඩා න්‍යාය

පදනම් කොට ගත් අධිකරණ විනිශ්චයකට භාජන නොකළ හැකි ආචාර ධර්ම පද්ධතියකි. වර්තමාන කර්තෘ සංසද ආචාර ර්ම පද්ධතිය, ශ්‍රී ලංකාවේ තත්ත්වයට ගැළපෙන ලෙසත් අධිකරණ විනිශ්චයට භාජන විය හැකි අන්දමිනුත් සම්පාදනය වී ඇති අතර එය, සමාන වෙනත් බොහෝ ලේඛනවලට වඩා කෙටිය. වඩාත් විස්තීර්ණ වුව හොත් එය කියවන පිරිස අඩුවීමත් කියවනු ලබන ප්‍රමාණය අඩුවීමත් නොවැළැක්විය හැකිය. එමගින් එය පසුගාමී වනු ඇත.

කෙසේ වුවද, නිතර අසනු ලබන ප්‍රශ්නවලට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම කලින් දී ඇති තීන්දු සහ උපදෙස් අනුව ලද අත්දැකීම් මත පිළිතුරු සපයන අතිරේක පත්‍රිකාවක් හෝ පොත් පිංචක් ප්‍රකාශයට පත්කිරීම විකල්පයක් සේ සැලකිය හැකිය. එවැනි පොත් පිංචක් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සමඟ ඒකාබද්ධ ප්‍රකාශනයක් වීම අවශ්‍ය වන අතර, නිතර පිළිතුරු සපයන ලද අනෙක් ප්‍රශ්න කෙරෙහිද එයින් අවධානය යොමු වීම අවශ්‍යය. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ කටයුතු සම්බන්ධයෙන් කර්තෘවරුන් හා පුවත්පත් කලාවේදීන් දැනුවත් කරනු පිණිස ආචාර ධර්ම කමිටුව ආචාර ධර්ම පද්ධතියේ විධිවිධාන අනුව එවැනි(නිතර අසනු ලබන ප්‍රශ්න ඇතුළත්) පත්‍රිකාවක් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ප්‍රකාශයට පත් කරනු ඇත.

ප්‍රකාශකයන් සඳහා වන ආචාර ධර්ම පද්ධතියක් සම්බන්ධයෙන් වරින් වර ඉස්මතුවන ප්‍රශ්න කෙරෙහිද ආචාර ධර්ම කමිටුවේ සැලකිල්ල යොමු වූවේය. එය පුවත්පත් සංගමයේ සැලකිල්ලට භාජන විය යුත්තක්ය යන්න කමිටුවේ මතය විය. එවැනි ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාව ප්‍රකාශකයනට දැනුම්දීමට කර්තෘ සංසදයට පුළුවන්කම ඇති අතර ප්‍රකාශකයකු හා කතුවරයකු අතර සම්බන්ධතාව අවශ්‍යයෙන්ම කාර්මික සම්බන්ධතාවක් වන හෙයින් එවැනි කාර්මික සම්බන්ධතාවක් හෝ අන්තර් පුද්ගල සම්බන්ධතාවක් ආචාර ධර්ම පද්ධතියකින් ආවරණය කළ හැකි නොවේය යන හැඟීම ප්‍රකාශ විය. එක්සත් රාජධානියේ ආචාර ධර්ම පද්ධතිය එවැනි ගිවිසුම්ගත බැඳීම්වලින් නිදහස්ව ක්‍රියාත්මක වන බව සඳහන් කරමු. එවැනි විධිවිධානයක් ඇතුළත් කැරුණ හොත්, කතුවරයා අභිබවා යන එක්තරා ස්වාධීනත්වයක් කර්තෘ මණ්ඩලය තුළ පුවත්පත් කලාවේදියකුට අතිරේක වශයෙන් ලැබිය හැකියැයි තර්කයක් ඉදිරිපත් වන්නට පිළිවන. එවැනි තත්ත්වයක් ප්‍රවෘත්ති අංශයෙහි ව්‍යාකූලතාවයකට හේතු වන්නට ඉඩ තිබේ. එහිදී කෙනෙකුට සීමාවක් පැනවිය හැක්කේ කොතැනකදීද යන ප්‍රශ්නය පැන නැගෙයි.

ප්‍රකාශකයන්ගේ හා කර්තෘවරුන්ගේ වෙන් වෙන් ගිවිසුම්වල අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් ආචාර ධර්ම පද්ධතියට එකඟතාව දක්වන ලෙස ප්‍රකාශකයන්ගෙන් ඉල්ලා සිටිය යුතුයැයි කමිටුව තරයේ අදහස් කරයි. ආචාර ධර්ම පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය දක්වන්නැයි ප්‍රකාශකයන්ගෙන් කරන ඉල්ලීමක්ද ඊට ඇතුළත් විය යුතුය. ආචාර ධර්ම පද්ධතිය අනාගතයේදී ප්‍රතිශෝධනය කළ යුත්තේ කෙසේද යන්න ගැන මහජනතාවගෙන් හා පුවත්පත් ක්ෂේත්‍රයෙන්ද අදහස් විමසමින් වඩාත් පුළුල් කමිටුවක් පත් කිරීම මැනවැයිද ආචාර ධර්ම කමිටුව නිර්දේශ කරයි. ඒ ආචාර ධර්ම කමිටුව එහි සාමාජිකයන්ගෙන් හා සාමාජිකයන් නොවනඅයගෙන්ද සමන්විත සහ රීති පද්ධතියකින් සීමා නොවන මණ්ඩලයක් වනු ඇත.

| | |
|---|---|
| උපාලි තෙන්නකෝන් | මනික් ද සිල්වා |
| සිරි රණසිංහ | ඒ. සිවනේසසෙල්වන් |
| සිංහ රත්නතුංග | ටී. කුරුවිට බණ්ඩාර |
| ජටිල වැල්ලබඩ | වී. තේවරාජ් |

2008 ජනවාරි

මෙම ස්ථානයට වෘත්තීය ප්‍රතිපත්ති මාලාව දමන්න

## ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම

## ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ රීති සහ පැමිණිලි කාර්ය පටිපාටිය.

1. ශ්‍රී ලංකාව තුළ ප්‍රසිද්ධ කරනු ලබන පුවත්පතක හෝ සඟරාවක පළකරන ලද ප්‍රවෘත්ති වාර්තාවක්,ලිපියක්, ජායාරූපයක් සහ/ හෝ චිත්‍ර හෝ රේඛීය නිර්මාණයකින් තමාට අහිතකර බලපෑමක් සිදුවී ඇතැයි සාධාරණ ලෙස විශ්වාස කරන යම් තැනැත්තෙකුට ඒ බව ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමට පැමිණිලි කළ හැකිය.අදාළත්වය අනුව ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම තෙවන පාර්ශ්වයීය පැමිණිලි ද භාරගත යුතුය.

2. එකී පැමිණිලිකරුගේ පැමිණිල්ල ලියවිල්ලකින් විය යුතු අතර නිසි ලෙස අත්සන් කොට, වඩා කැමති නම් නියමිත ආකෘති පත්‍රයෙන් කරනු ලැබ ශ්‍රී ලංකා පුවත් පත් පැමිණිලි කොමිසම වෙත පුද්ගලිකවම භාරදීම හෝ ලියාපදිංචි කළ තැපෑලෙන්, ෆැක්ස්, හෝ ඊ-මේල් මගින් ලැබීමට සැලැස්විය යුතුය.

3. තමාට අහිතකර සේ බලපෑමක් සිදු වූයේ යැයි චෝදිත පළකිරීමේ පිටපතක් පැමිණිලි කරු විසින් එකී පැමිණිල්ලට ඇමිණිය යුතුය. ඊ-මේල් හෝ යම් විද්‍යුත් පණිවුඩ හුවමාරු ක්‍රමයක් මඟින් පැමිණිල්ල යොමු කර ඇති අවස්ථාවක නිසි ලෙස සම්පූර්ණ කළ පැමිණිලි ආකෘති පත්‍රය සමඟ පැමිණිල්ලේ සහ චෝදිත පළකිරීමේ පිටපතක් ද වැඩ කරන දින හතක් තුළදී ශ්‍රී ලංකාවේ පුවත්පත් පැමිණිලි කොමිසම වෙත ඉදිරිපත් කළ යුතුය.

4. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය පිළිගෙන ඇති ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව, චෝදිත පළකිරීමෙන් කඩ වී ඇති බව පෙනී යන්නේ නම් පමණක් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ප්‍රධාන විධායක නිලධාරී විසින් නිසි ලෙස ලැබී ඇති පැමිණිල්ලක් ලෙස භාරගත යුතුය.

5. කිසියම් පළකිරීමක් එය පළකිරීමෙන් අවුරුදු දෙදකට පසු ඊට එරෙහිව කෙරෙන පැමිණිල්ලක් ප්‍රධාන විධායක නිලධාරී විසින් භාර නොගත යුතුයි.

6. පැමිණිල්ලක් භාරගැනීමෙන් පසු ප්‍රධාන විධායක නිළධාරී විසින් ඒ බව පැමිණිලිකරුට පිටපතක් ද සහිතව උක්ත පුවත්පතේ හෝ සඟරාවේ කර්තෘ වරයා වෙත දැනුම් දිය යුතු අතර එකී කතෘවරයා ගෙන් වැඩ කරන දින පහක කාලයක් තුළ පිළිතුරක් එවන ලෙස ඉල්ලා සිටිය යුතුය.

7. තමාගේ පිළිතුරු නියමිත දිනයේදී ඉදිරිපත් කිරීමට එම පුවත්පතේ හෝ සඟරාවේ හෝ කර්තෘ වරයාවිසින් පැහැර හැරීමේ ප්‍රතිඵලය වන්නේ එකී පැමිණිල්ල ශ්‍රී ලංකා පුවත් පත් පැමිණිලි කොමිසම් සභාව විසින් විනිශ්චය කිරීම සඳහා සෘජුව ඒ වෙත යොමු කිරීමයි. එසේ වුව ද කර්තෘ වරයා හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තෙකු විසින් උත්තර දීම සඳහා ලිඛිතව හේතු දක්වා සිටියහොත් සහ ඒ ඉල්ලීම සාධාරණ ඉල්ලීමක් බව ප්‍රධාන විධායක නිළධාරී විසින් සලකනු ලබන්නේ නම් ප්‍රධාන විධායක නිලධාරී විසින් එලෙස කාලය ලබා දීම කරනු ලැබිය හැකිය.

8. ඉතා කෙටිම කාලයක් තුළදී එහෙත් ඒ පැමිණිල්ල භාරගැනීමේ දිනයේ සිට සති හතරකට වැඩිනොවන කාලයක් තුළදී සමාදාන කිරීමක් මඟින් සහ / හෝ සමථයකට පත් කිරීම මඟින් නිරවුල් කිරීමකටඑළඹවීමට දෙපාර්ශ්වයට පහසුවන පිණිස ප්‍රධාන විධායක නිලධාරී විසින් සියලු උත්සහ දැරිය යුතුය. එවැනි නිරවුල් කිරීමකට නිවැරදි කිරීමක් සහ / හෝ සමාව ඇයදීමක් සහ / හෝ පිළිතුරු දීමට ඇති අයිතිය හෝ ඇතුළත් විය හැකිය.

එසේ වුව ද ප්‍රධාන විධායක නිලධාරී විසින් එවැනි සමථයකට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සහ සාමාජිකයෙකුගේ සහය ලබාගත යුතුය.

9. ශ්‍රී ලංකා පුවත් පත් පැමිණිලි කොමිසම ඉදිරිපිට කරන ලද සමථයක් ප්‍රකාරව, පැමිණිල්ල කරන ලද්දේ කවර පුවත් පතකට හෝ සඟරාවකට හෝ එරෙහිව ඒ පුවත්පත් හෝ සඟරාව හෝ විසින් නිවැරදි කිරීමක් සහ / හෝ සමාව ඇයදීමක් සහ / හෝ පිළිතුරු දීමේ අයිතියක් හෝ පළකරනු ලැබූ විට ඒ පුවත් පතේ හෝ සඟරාවේ හෝ එම පළකිරීම කරන ලද්දේ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම ඉදිරිපිටදී එළඹුනු නිරවුල් කිරීමක් ප්‍රකාරව බව එකී පුවත් පතේ හෝ සඟාරාවේ විශේෂයෙන් සඳහන් කළ යුතුය.

10. සමාදාන කිරීම සහ / හෝ සමතයකට පත් කිරීම හෝ මඟින් නිරවුල් කිරීමක් නොකල හැකි අවස්ථාවක, සමාදාන කිරීම සහ / හෝ සමතයකට පත් කිරීම හෝ මඟින් නිරවුල් කිරීමකට එළඹීමට නොහැකි වු දිනයේ සිට සති දෙකක් ඇතුළතදී ශ්‍රී ලංකා පුවත් පත් පැමිණිලි කොමිසම් සභාව විසින් පැමිණිල්ල විනිශ්චය කළ යුතුය.

11. ඉහත කුමක් සඳහන් වුවද මහජන යහපත සඳහා සහ / හෝ පුවත් පත් කර්මාන්තයේ යහපත. සඳහා සහ / හෝ පැමිණිලිකරුගේ යහපත සඳහා හෝ එවැනි නිශ්චය කිරීමක් අවශ්‍ය කරන බව ඔහුට /ඇයට පෙනීගියේ නම් ප්‍රධාන විධායක නිලධාරී විසින් භාරගන්නා ලද යම් පැමිණිල්ලක් විනිශ්චය කිරීම පිණිස කෙලින්ම ශ්‍රී ලංකා පුවත් පත් කොමිසම් සභාව වෙත යොමුකළ හැක්කේය.

12.එවැනි විනිශ්චය කිරීමක් සඳහා ප්‍රධාන විධායක නිලධාරීවරයා විසින් බේරුම් නිරාකරණ මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙකු පත්කළ යුතුය.

13. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභාව විසින් කරනු ලබන යම් විනිශ්චය කිරීමක් සඳහා ගණපූරණය තුනක් විය යුතු අතර එහිදි හැම විටම පුවත්වත් වළට සම්බන්ධයක් නැති සාමාජිකයන්ගේ බහුතරයක් පවත්වාගෙන යා යුතුය.

14. පැමිණිලි කරන ලද කාරණය පිළිබඳ නිශ්චිත පුද්ගලික සම්බන්ධතාවයක් ඇති ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභාවේ සාමාජිකයෙකු එවැනි විනිශ්චය කිරීමකට සහභාගී නොවිය යුතුය.

**සාක්ෂි**

15.බේරුම් කිරීමේ විනිශ්චය සභාවේ ඉල්ලීම් පිට, එමඟින් ඔප්පු කිරීමට ඔහුන් බලාපොරොත්තු වන්නේ කුමක්ද යන්න නිශ්චිතවම දක්වමින් තමන් තහවුරු කිරීමට අපේක්ෂා කරන සාක්ෂි , පාර්ශ්ව කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

16.බේරුම් කිරීමේ විනිශ්චය සභාව විසින් ඉල්ලා සිටින පරිදි, තමන් විශ්වාසය තබන ලේඛනමය සාක්ෂි පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

17. බේරුම් කිරීමේ විනිශ්චය සභාව විසින් උචිත යැයි සලකන විට, ලිඛිත දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස නියම කළ හැකිය.

18. බේරුම් කිරීමේ විනිශ්චය සභාව විසින්, එවැනි සාක්ෂි අවශ්‍ය නොවන බව හෝ අදාළ නොවන බව හෝ කිසියම් විශේෂ කාරණයක් මත වෙනත් මාර්ග වලින් වඩා සරළව ඔප්පු කිරීම තහවුරු කළ හැකි බව හෝ හැගේ නම්, එසේ නොකොට ඉදිරිපත් කරන ලද සාක්ෂි පිළිගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

19.ඉහත සඳහන් රීති වලට අනුකූලව ආරවුලට සම්බන්ධ පාර්ශ්ව කරුවන් විසින් ඉදිරිපත් කරන කරුණු පරිපූර්ණව ඉදිරිපත් කිරීම අවශ්‍යයයි නියම කළයුතු අතර, එම නියමය අනුව ක්‍රියාකිරීමට අපොහොසත් වුවහොත් නඩුව නිශ්ප්‍රභ කරනු ලැබිය හැකිය. ආරවුලට සම්බන්ධ පළකිරීමේ කිසියම් පාර්ශ්වයක් පවත්නා රීති වලට අනුකූලව අවශ්‍ය කරුණු

දැන්වීමට අපොහොසත් වුවහොත් එම අපොහොසත් වීම බේරුම් කිරීමේ කාර්යය පටිපාටිය අඛණ්ඩව පවත්වාගෙන යෑම වළක්වාලනු නොලැබිය යුතුය.

20.පාර්ශ්ව කරුවන් අන්‍යාකාරයෙන් එකඟ වුවහොත් මිස බේරුම් කිරීමේ විනිශ්චය සභාව විසින් යම් විශේෂ කාරණයක් මත ස්වකීය මතය ප්‍රකාශ කිරීම පිණිස විශේෂඥයෙකු පත්කළ හැකිය.

21. පාර්ශ්වකරුවෙකු විභාග කිරීමකදී පෙනීසිටීම හෝ අන්‍යාකාරයෙන් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරියහොත් සහ ඒ පැහැර හැරීම සඳහා වලංගු හේතු දක්වා නොසිටිය හොත් එවිට ඒ පැහැර හැරීම හේතුවෙන් නඩු කටයුතු හෝ බේරුම් කිරීමේ විනිශ්චය සභාව වළක්වාලනු නොලැබිය යුතුය.

**තීරණය**

22.වෙනත් යම් සහනයක් ප්‍රධානය කිරීමට ආරවුලට සම්බන්ද පර්ශ්වකරුවන් විසින් ලියවිල්ලකින් බේරුම් කරු වෙත ප්‍රකාශිතවම බලය පවරන්නේනම් මිස, යම් බේරුම්කාර කාර්ය පටිපාටියකදී ප්‍රදානයකට බේරුම්කරුට ඇති බලතල, ආරවුලට පාර්ශ්වකරුවෙකු වූ පළකිරීම කරුණු ලැබූ තැනැත්තාට ආරවුලකට භාජණය වූ කාරණය පළකරන ලද්දේ කවර මාධ්‍යයකින් ද ඒ මාධයයෙන් පිළිතුරු දීමට හැකි අයිතියක් හා / සහ හෝ නිවැරදි කිරීමක් සහ / හෝ සමාව ඇයදීමක් හෝ පළකරන ලෙසට නියමයක් කිරීමට සීමාවිය යුතුය.

23.සභාව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරනු ලබන්නේ නම් මිස බේරුම්කාර තීරණයක්, ඉල්ලීම් ප්‍රකාශය ඉදිරිපත් කරන ලද දිනයේ සිට එක් (01) මාසයකට නොවැඩි කාලයක් තුළදී කරනු ලැබිය යුතුය.

24. නිරවුල් කිරීමක් කරනු ලැබුවහොත් පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම පිට එය කරන බවට සභාව විසින් තම තීරණයෙහි ස්ථිර කළ යුතුය.

25. කාර්යය පටිපාටියෙහි සියළු අංග හෘදසාක්ෂියට එකඟව සලකා බැලීමෙන් සහ ඇගයීමෙන් පසුවඑම නඩුවේ දී ඔප්පු වූයේ කවරක් ද යන්න තේරුම් කිරීමේ විනිශ්චය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතුය.

26. කවර කරුණක් නිසා හෝ තේරුම් කිරීමේ විනිශ්චය මණ්ඩලය ලෙස සම්පූර්ණ සභාවම රැස්වන විට තේරුම් කිරීමේ විනිශ්චය මණ්ඩලය බහුතර මතය බලපැවැත්විය යුතුය.

27.වෙන වෙනම විසඳිය යුතු ප්‍රශ්ණයක් හෝ පාර්ශ්වකරුවන් අතර වූ ආරවුලේ කාරණයේ කොටසක් හෝ පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම පිට වෙන වෙනම වූ තීරණයක් මඟින් කළ යුතුය. යම් පාර්ශ්වයක් විරෝධය පාන්නේ නම් තත්කාලීන හා ව්‍යතිරේක තිබෙන බවට තේරුම් කිරීමේ විනිශ්චය මණ්ඩළය සලකන්නේ නම් පමණක් එවැනි තීරණයක් කළ හැකිය.

28. පාර්ශ්වයක් විසින් ඉල්ලීමක් අර්ධ වශයෙන් පිළිගෙන ඇති අවස්ථාවක බේරුම් කිරීමේ විනිශ්චය මණ්ඩලය විසින් පැමිණිල්ලේ පිළිගෙන ඇති කොටස මත වෙනම තීරණයක් දිය හැකිය.

29. තීරණය, බේරුම් කිරීම කරනු ලබන ස්ථානයේදි කළ යුතුය. තීරණයට නියමයක් හෝ ප්‍රකාශයක් ද ඒ සඳහා හේතු ද අන්තර්ගත විය යුතු අතර එය අවස්ථාවෝචිත පරිදි බේරුම් කරු විසින් හෝ බේරුම් කරුවන් සියලු දෙනා විසින් අත්සන් කළ යුතුය. තීරණය බේරුම්කරුවන් බහුතරයක් විසින් අත්සන් කර ඇත්නම් සහ අත්සන නොමැති බේරුම් කරු ආරවුල ගැන තීරණය කිරීමට සහභාගී වූ බවට ඔවුන් විසින් කරන සඳහනක් හෝ අන්තර්ගත නම් බේරුම්කරුවෙකුගේ අත්සන නොමැතිව පවා දෙනු ලැබිය හැකිය.

30. බේරුම් කිරීමේ විනිශ්චය මණ්ඩලය විසින් බේරුම් කිරීමේ කාර්ය පටිපාටිය අවසන් කළ පසු එක් එක් තීරණයක පිටපතක් මෙන්ම සියලු කාර්ය පාටිපාටියේ වාර්තාව ද කොමිසමට ඉදිරිපත් කළ යුතුය. තීරණය නිවැරදි කිරීම හෝ වෙනස් කිරීම.

31. තීරණයක පැහැදිලිව පෙනෙන වැරදි ගණන් බැලීමක් හෝ ලිපිකරු දෝෂයක් බේරුම් කිරීමේ මණ්ඩලය විසින් නිවැරදි කළ යුතුය.

32. තීරණය ලැබී දින තිහක් (30) ඇතුළත දී පාර්ශ්වයක් විසින් එලෙස ඉල්ලා සිටියහොත් විනිශ්චය මණ්ඩලය විසින් තීරණය කළ යුතුව තිබුණු නමුත් එහිදී තීරණය කරනු නොලැබූ විසඳිය යුතු ප්‍රශ්ණයක් පිළිබඳව තීරණය කළ හැකිය.

33. තීරණය ලැබී දින තිහක් (30)ක් ඇතුළත දී පාර්ශ්වයක් විසින් එලෙස ඉල්ලා සිටියහොත් තේරුම් කිරීමේ විනිශ්චය මණ්ඩලය විසින් එහි ලිඛිත අර්ථ නිරූපණයක් ලැබෙන්න සැලැස්විය යුතුය.

34. බේරුම්කිරීමේ විනිශ්චය මණ්ඩලය විසින් එවැනි ක්‍රියාවක් ගැනීමට පෙර පාර්ශ්වකරුවන්ට ඔහුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් සලස්වා දිය යුතුය.

**බලාත්මක කිරීම.**

35.සමථකරණ, මැදිහත්කරණ සහ / හෝ බේරුම් කරණ කාර්ය පටිපාටිය නිරවුල් කිරීමේනියමයන්ගෙන් බැදී සිටීම පැහැර හරින අවස්ථාවක එහි නිරවුල් කිරීමේ නියමයන් 1995 අංක 11 දරණ බේරුම් කිරීමේ නියමයක් අනුව මහාධිකරණය ඉදිරියේදී බලාත්මක කිරීමට සභාව විසින් පැමිණිලිකරුටආධාර කළ යුතුය.

36. බේරුම්කරණ තීරණයක් කිරීමෙන් දින දහහතරක් (14) ඉකුත් වීමෙන් පසු අවුරුදු එකක් (01) ඇතුළත මහාධිකරණය වෙත අයදුම් කිරීමෙන් ඒ තීරණය 1995 අංක 11 දරන බේරුම්කිරීමේ පණතේ විධි විධාන වලට අනුකූලව බලාත්මක කරනු ලැබිය හැකිය.

37. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභාව විසින් කරන ලද යම් විනිශ්චය කිරීමක් අදාළ පුවත් පත හෝ සඟරාව හෝ විසින් ඉන්පසුව පළකරන මුල්ම කලාපයේ සම්පූර්ණයෙන්ම පළකල යුතුය.

38. ශ්‍රී ලංකා පුවත් පත් පැමිණිලි කොමිසම් සභාව විසින් කරන ලද එවැනි විනිශ්චය කිරීමක් 1995 අංක 11 දරණ බේරුම් කිරීමේ පණතේ සඳහන් බේරුම් කිරීමේ විනිශ්චය මන්ඩලයක් විසින් දෙන ලද තීරණයකට සමාන විය යුතු අතර එය විනිශ්චය කිරීම, බලාත්මක කිරීම සඳහා එකී පණතේ විධි විධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඊට අදාළ විය යුතුය.

39. ප්‍රධාන විධායක නිලධාරිගේ යම් තීරණයක් සහ / හෝ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ යම් විනිශ්චය කිරීමක් හෝ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර අධිකරණයක් ඉදිරියේ අභියෝග කරණු නොලැබිය හැකිය.

40. ලැබෙන සියලු පැමිණිලි වල සහ සමථකරණ, මැදිහත්කරණ, සහ බේරුම්කරණ, පටිපාටියේ තීරණ වල වාර්තා ප්‍රධාන විධායක නිලධාරී විසින් පවත්වාගෙන යා යුතු අතර වාර්ෂික වාර්තාවක් ලෙස කොමිසමට ලබා දිය යුතුය. ඉක්බිති කොමිසම විසින් කරනු ලබන ප්‍රසිද්ධ ප්‍රකාශණයක් ලෙස එය මහජනයාට ලබා දීමට හැකිවිය යුතුය.

41. මේ ක්‍රියා මාර්ගය 2003 ඔක්තෝම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව පුවත්පතක හෝ සඟරාවක පළකරන ලද පළකිරීමකට එරෙහි යම් පැමිණිල්ලක් සඳහා ක්‍රියාත්මක විය යුතුය.

42. ශ්‍රී ලංකා පුවත් පත් ආයතනය විසින් සහ ශ්‍රී ලංකා පුවත් පත් පැමිණිලි කොමිසම විසින් සම්මත කරගත් පරිදී වූ ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව පිළිබඳ අර්ථ නිරූපණය කිරීම මෙම රීති යටතේ සියලු විධි විධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සභාව වෙත සතුවිය යුතුය.

**ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ප්‍රකාශක වරයා**

43. සමාගමට අදාළ සියලු ප්‍රතිපත්ති කාරණා සඳහා ප්‍රකාශකවරයා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සභාපති වරයා හෝ මණ්ඩලය වෙනුවෙන් කතා කිරීමට බලය දී ඇති මණ්ඩලයේ කිසියම් සාමාජිකයෙකු හෝ විය යුතුය.

44. ලැබුණු සියලු පැමිණිලි සඳහා සහ සභාව විසින් ගන්නා ලද සියලු තීරණ සඳහා ප්‍රකාශකවරයා ප්‍රධාන නිලධාරියා විය යුතුය. එසේ වුව ද එසේ කිරීම දූරදර්ශී යැයි සිතන අවස්ථාවක පැමිණිලි මණ්ඩලය සභාවේ සභාපති වරයා විමසිය යුතු අතර කවර කරුණක් නිසාවත් සිදුවෙමින් පවතින පරීක්ෂණයක් සම්බන්ධ විස්තර හෝ සභාව විසින් කරන ලද යම් බේරුම් කිරීමේ තීරණ හෝ පිළිබඳ විද්‍යුත් මාධ්‍ය වලට සහ / හෝ මහජනයාට සභාවේ සභාපති වරයා සහ / හෝ බේරුම් කිරීම් මුල මණ්ඩලය හෝ විමසීමෙන් පසුව මිස ලබා නොදිය යුතුය.

45. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ක්‍රියාකාරීත්වයට අදාළව කිසියම් ලිපියක් සැපයීමට හෝ විද්‍යුත් මාධයෙහි දි යම් මාධ්‍ය සාකච්ඡාවකට පාර්ශවයක් වීමට කැමති ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ යම් නිලධාරියෙකුට ප්‍රධාන විධායක නිලධාරියාගේ පූර්ණ අනුමැතිය අභිප්‍රේෂිතව ලියවිල්ලකින් ලබා ගැනීමට නියම කරනු ලැබේ. කවර කරුණක් නිසාවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ පරම අයිතියක් වන කිසියම් ප්‍රතිපත්තිමය කාරණාවක කාථාකිරීමෙන් එම නිලධාරියා වළක්වාලනු ලැබේ.

46. ප්‍රධාන විධායක නිලධාරියා විසින් කරනු ලබන සියලු පුවත්පත් නිවේදන සහ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සභාපතිවරයා ගේ පූර්ණ අනුමැතිය අවශ්‍ය වේ. කෙසේ වුව ද ඒවා පැමිණිල්ලකට අදාළ යම් කාරණයක් සම්බන්ධ වන විට ඊට පැමිණිලි කොමිසමේ සභාපතිවරයාගේ අනුමැතිය අවශ්‍ය වේ.

47.වාර්ෂිකව සමාලෝචනය කරන මෙම කාර්ය පටිපාටියේ අවශ්‍යතාවයන්ට ගැළපෙන ආකාරයට කරන සංශෝධන ප්‍රධාන විධායක නිලධාරීවරයා විසින් ආරවුල් නිරාකරණ මණ්ඩලයේ අනුමතිය ලබාගෙන සම්මතකොට ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

# ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම

## පැමිණිලි පත්‍රිකාව

1 සම්පූර්ණ නම :- ---------------------------------------------------------------------------

2 ලිපිනය :- ---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

3 දුරකථන අංකය :- --------------------ජංගම දුරකථන අංකය :- ----------------------

4 ෆැක්ස් පණිවුඩ අංකය :- ------------------විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනය:- --------------

5 පුවත්පත/සඟරාව :- ---------------------------------------------------------------------------

6 පළවූ දිනය :- ---------------------------------------------------------------------------

7 සිරස්තලය :- ---------------------------------------------------------------------------

ඔබේ අවබෝධය පරිදි ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව කුමන ආකාරයකින් කඩකර ඇද්දැයි පැහැදිලි කරන්න.ඔබ දන්නේ නම්,එම ප්‍රතිපත්ති මාලාවේ කුමන වගන්තිය/වගන්ති කඩකර ඇද්ද යන බව ද සඳහන් කරන්න.(මෙම ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් අතිරේක කඩදාසියක් පාවිච්චි කරන්න.ඔබගේ පැමිණිලිල සනාථ කළ හැකි වෙනත් ලිපිලේඛන තිබේ නම් ඒවාද ඉදිරිපත් කරන්න.)

------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------

මෙහි අත්සන් තැබීමෙන් මම පහත දැක්වෙන රෙගුලාසි හා රීති පිළිගැනීමට එකඟ වෙමි.

1ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ දැනට බලපැවැත්වෙන පැමිණිලි සම්බන්ධ ක්‍රියාපටිපාටියේ රීතිවල සඳහන් පරිදි සමථකරණය සහ/හෝ මැදිහත්කරණය සහ/හෝ බේරුම්කරණය හෝ ක්‍රියාවලියට සම්බන්ධවීමට මම එකඟ වෙමි.

2ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම ඉදිරියේ දෙපාර්ශ්වය විසින් එළඹ ගන්නා එකඟතාවයකට සහ/හෝ සමථයකට අනුව ක්‍රියා කිරීමටත්, කොමිසම මගින් බේරුම්කරණය පිළිබඳ දෙනු ලබන තීන්දුවකට අනුකූලවීමටත් මම එකඟ වෙමි.

3 මගේ පැමිණිල්ල මගින් විරෝධය පළකරනු ලබන ලිපියේ පිටපතක් ද ඒ පිළිබඳ වූ මගේ කරුණු පැහැදිලි කිරීම ද මේ සමග ඉදිරිපත් කරමි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ පුවත්පත් පැමිණිලි විභාග කිරීම පිළිබඳ රීති මාලාවේ 38 වන වගන්තිය මෙසේය.
ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ පැමිණිලි මණ්ඩලයෙන් පිරිනමනු ලබන විනිශ්චයක් 1995 අංක 11 දරණ බේරුම්කරන පනතේ සඳහන් වන බේරුම්කාරක සභාවක් විසින් පිරිනමනු ලබන තීරණය හා සමාන වන අතර,ඉහත විනිශ්චයක් බලාත්මක කිරීම සම්බන්ධයෙන් ඉහත පනතේ විධිවිධානයන් අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ වේ.
ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ හෝ එහි බේරුම්කරණ මණ්ඩලයේ ඕනෑම තීරණයක් අවසාන නිගමනය වන අතර එය අධිකරණයක් ඉදිරියේ අභියෝගයට ලක් කළ නොහැකිය.

දිනය:- --------------------------------  --------------------------------

පැමිණිලිකරුගේ ත්සන

# කර්තෘ සංසදයේ වෘත්තීය ආචාර ධර්ම සමාලෝචන කමිටු වාර්තාව

**පසුබිම .**

2002/03 වසර තුළදී හෝ ඊට ආසන්න කාලයකදී ශ්‍රී ලංකා කර්තෘ සංසද සාමාජිකයෝ 'පුවත්පත් කලාවේදීන්ගේ ආචාර ධර්ම පද්ධතිය' යනුවෙන්ද හැඳින්වුණු වෘත්තීය ආචාර ධර්ම මාලාව ඒකච්ඡන්දයෙන් සම්මත කළහ.

ඒ වන විටද වෙනත් ආචාර ධර්ම මාලාවක් තිබුණු නමුත් ඒ බව දැන සිටියෝ සුළු පිරිසකි. එය ක්‍රියාත්මක කළෝ ඊටද වඩා සුළු පිරිසකි. එය, 1980 ගණන්වල මුල් භාගයේදී ව්‍යවස්ථාගත පුවත්පත් මණ්ඩලය විසින් කෙටුම්පත් කරනු ලැබ පුවත්පත් මණ්ඩල නීතිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආචාර ධර්ම පද්ධතියයි. කවදාවත් ප්‍රායෝගික තත්ත්වයට පත් නොවුණු තරම්යැයි කිව හැකි නමුත් එය සැබැවින්ම රටේ නීතිය බවට පත්ව තිබිණි.

පුවත්පත් මණ්ඩලයේ ආචාර ධර්ම පද්ධතියත් පුවත්පත් කලාවේදීන් සඳහා වන විවිධ විදේශීය ආචාර ධර්ම පද්ධති මෙන්ම ශ්‍රී ලංකාවෙහි පවත්නා මාධ්‍ය සංස්කෘතියද සැලැකිල්ලට ගනිමින් කර්තෘ සංසදය ආචාර ධර්ම මාලාවක් කෙටුම්පත් කළේය. 1998 මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශනයෙහි දැක්වුණු මූලධර්මද කර්තෘ සංසද ආචාර ධර්ම පද්ධතියට පදනම් වූයේය.

අහෝසි කරන ලද සාපරාධ අපහාස නීති වෙනුවට ස්වයං නියාමන යාන්ත්‍රණයකින් ක්‍රියාත්මක වන උපදෙස් මාලාවක් පනවා ගන්නා ලෙස දේශපාලකයන් හා පොදු ජනතාව පුවත්පත් කලාවේදීන්ගෙන් කළ ඉල්ලීමට පිළිතුරු වශයෙන් කොළඹ ප්‍රකාශනයේ අත්සන්කරුවන් දුන් ප්‍රතිඥාවක ප්‍රතිඵලයක් වශයෙන් කර්තෘ සංසද ආචාර ධර්ම පද්ධතිය එළි දැක්කේය.

2002 දී පාර්ලිමේන්තුව සාපරාධී අපහාස නීති ඒකච්ඡන්දයෙන් අහෝසි කළ අතර ශ්‍රී ලංකා කර්තෘ සංසදය ආචාර ධර්ම පද්ධතිය පැනැවීමෙන් 'ගිවිසුමේ' ඊට අයත් කොටස ඉටු කෙළේය. අලුතෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය ඒ ආචාර ධර්ම පද්ධතිය ක්‍රියාත්මක කරනු පිණිස පුවත්පත් පැමිණිලි කොමිසම පිහිටුවූයේය.

සංස්ථාපිත පුවත්පත් මණ්ඩල නීතිය යටතේ වූ ආචාර ධර්ම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව කර්තෘ සංසද ආචාර ධර්ම පද්ධතිය බිහිවීමත් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම ස්ථාපනය වීමත් නිසා අහෝසි විය. ඒ නිසාම, පුවත්පත් මණ්ඩලයද 2002 පටන් අක්‍රීය වූයේය.

<u>වර්තමාන තත්ත්වය ඃ</u>

ආචාර ධර්ම පද්ධතියේ වාර්ෂික සමාලෝචනය සඳහා කර්තෘ සංසද ආචාර ධර්ම පද්ධතියෙන් ඉඩ සැලැසෙයි. එය සමාලෝචනයක් විනා අනිවාර්ය ප්‍රතිශෝධනයක් නොවන බවද මෙහිලා සඳහන් කළ යුතුව තිබේ. එසේ වුවද, කර්තෘ සංසදය 2002 න් පසු ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ නිසි සමාලෝචනයක් සිදු කොට නැති බවද වරද පිළිගැනීමක් වශයෙන් කිව යුතුය. 2005 දී කර්තෘ සංසදය, ජාත්‍යන්තර අධිකරණයේ විශ්‍රාමික උපසභාපති හා පුවත්පත් නිදහස පිළිබඳ සුප්‍රකට ලේඛකයකුද වන විනිසුරු ක්‍රිස්ටෝෆර් වීරමන්ත්‍රී මහතාගේ ප්‍රධානත්වයෙන් ආචාර ධර්ම සමාලෝචන කමිටුවක් පත් කෙළේය. සිවිල් සමාජයේත් පුවත්පත් ක්ෂේත්‍රයේත් ප්‍රමුඛ පෙළේ පුද්ගලයන් කීප දෙනකුගෙන්ද ඒ කමිටුව සමන්විත විය. ආචාර ධර්ම පද්ධතියෙහි කිසියම් ප්‍රතිශෝධනයක් සිදුවීම අවශ්‍යයැයි හැඟේ නම් ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වරමද ඒ කමිටුවට හිමිව තිබිණි.

ආචාර ධර්ම කමිටුව රැස්වූයේය, අදහස් හුවමාරු කර ගත්තේය. එහෙත් අවුරුදු දෙකකට ආසන්න කාලයක් තුළ කිසිදු නිර්දේශයක් ඒ කමිටුවෙන් කර්තෘ සංසදය වෙත ඉදිරිපත් නොවූයේය. නිර්දේශ ඉදිරිපත් කරනු පිණිස සමාන්තර ආචාර ධර්ම සමාලෝචන කමිටුවක් පත් කරන ලෙස කර්තෘ සංසදය 2007 දී පුවත්පත් පැමිණිලි කොමිසමෙන් ඉල්ලා සිටි අතර කොමිසම ඒ සඳහා ක්‍රියාත්මක විය. සමාන්තර කමිටුවට සිය නිර්දේශ ඉදිරිපත් කරන ලෙස මහජනතාවට ඇරියුම් කැරිණි. වාර්තාවක් ඉදිරිපත් කිරීමට තමාට පුළුවන්කමක් නැතැයි විනිසුරු වීරමන්ත්‍රී පුවත්පත් පැමිණිලි කොමිසමට දැන්වීය.

ආචාර ධර්ම මාලාවෙහි යම් ප්‍රතිශෝධනයක් අවශ්‍ය නම් එසේ කිරීමේ බලාපොරොත්තුව ඇතිව, නිර්දේශ අධ්‍යයන කොට තමන් වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු පිණිස කර්තෘ සංසදයද ඒ කාලය තුළම සිය සාමාජිකයන්ගෙන්ම සමන්විත ආචාර ධර්ම සමාලෝචන කමිටුවක් පත් කෙළේය. ඒ අනුව කර්තෘ සංසද ආචාර ධර්ම සමාලෝචන කමිටුව ගත් එක් පියවරක් වූයේ, එහි කටයුතුවලට සහාය වීම සඳහා එක්සත් රාජධානියේ කර්තෘවරුන්ගේ ආචාර ධර්ම කමිටුවේ ලේකම් ඉයන් බීල්ස් මහතාට ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස ආරාධනා කරන්නැයි ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයෙන් ඉල්ලා සිටීමය. බීල්ස් මහතා ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ දැනුමක් ඇත්තකු වුණාක් මෙන්ම ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පිහිටුවීමෙහිලා එහි මුල් අදියරවලදී විශේෂයෙන්ම පොදු රාජ්‍ය මණ්ඩල පුවත්පත් සංගමයේද අනුග්‍රහය ඇතිව උපකාරී වූවන් අතර වැදගත් තැනක් ගත්තෙක්ද විය.

2007 ඔක්තෝබර 16 වැනිදා කොළඹට පැමිණි බීල්ස් මහතා මෙහි නැවැතී සිටි සතියක කාලය තුළ ආචාර ධර්ම සමාලෝචන කමිටුවත් පුවත්පත් පැමිණිලි කොමිසමේ, අරගල විසඳුම් කමිටුවේ සභාපතිවරයා සහ සාමාජිකයනුත් පුවත්පත් පැමිණිලි කොමිසමේ ලේකම් මණ්ඩලයත් වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමය ඇතුළු මාධ්‍ය සංවිධාන කීපයක නිලධාරි මණ්ඩලත් මුණ ගැසුණේය.

බීල්ස් මහතාත් කර්තෘ සංසද ආචාර ධර්ම සමාලෝචන කමිටුවත් අතර ප්‍රයෝජනවත් සාකච්ඡා පැවැත්විණි. බීල්ස් මහතා පෙරළා එක්සත් රාජධානිය බලා යද්දී කමිටුවේ ඉල්ලීම අනුව ඔහුගේ නිර්දේශ අප වෙත එව්වේය. ඒ වාර්තාව ආචාර ධර්ම සමාලෝචන කමිටුවේ පරීක්ෂාකාරී සැලකිල්ලට භාජන කරනු පිණිසත් සංසද ආචාර ධර්ම මාලාවේ සංශෝධන වශයෙන් අනුමත කර ගැනීම සඳහාත් පහත දැක්වෙන නිර්දේශ සංසද සාමාජිකත්වය වෙත ඉදිරිපත් කිරීමට කමිටු සාමාජිකයෝ කැමැත්තෝය:

<u>ආචාර ධර්ම මාලාවෙහි කළ හැකි වෙනස්කම් පිළිබඳ නිර්දේශ</u>

ආචාර ධර්ම පද්ධතිය වාර්ෂිකව සමාලෝචනය නොවීම කනගාටුදායක කරුණක් වුවද එය ව්‍යසනයක් නොවේ. සමාලෝචන අවශ්‍යතාව යන්නෙන් අදහස් කැරෙන්නේ ඉබේ සිදුවන වෙනස්කම් නොවේ. පිරුවිය යුතු හිදැසක් ඇති බවට දැක්වෙන විශේෂ සාක්ෂි මත පමණක් ප්‍රතිශෝධන සිදු විය යුතුය. පමණට වැඩි වෙනස්කම් නිසා නිරන්තර අවුල් හටගනී. තීරණ ගැනීමේ ශක්තිය නැති බව ප්‍රකට වෙයි. එහි ප්‍රතිඵලය වන්නේ එකඟතාවක් ඇති නොවීමයි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමෙන් ඉදිරිපත් වුණු අදහස්වලින් දැක්වුණේ දණ්ඩනකාරී අභිප්‍රායයකි. පුවත්පත් පැමිණිලි කොමිසමේ පූර්ව යෝජනා, අතවනන කර්තෘවරුනට පාඩමක් උගැන්වීම සඳහා තත්ත්වය වඩාත් දැඩි කිරීම පිණිස සැකැසුණු සේ පෙනී යයි. එය හරිමඟ නොවියැයි අපි අදහස් කළෙමු. ආචාර ධර්ම මාලාව දැනටමත් දැඩිය. එය ක්‍රියාත්මක නොකැරෙන්නේ නම් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම බලහත්කාරය නොව කරුණු ඒත්තු ගැන්නීමේ මඟට පිවිසිය යුතුය.

ආචාර ධර්ම පද්ධතියෙහි කළ හැකි වෙනස්කම් වශයෙන් මේ කරුණු සලකා බැලීම මැනවි:

1. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සමඟ සහයෝගිතාව අවශ්‍ය බව ප්‍රකාශ කරන වගන්තියක් පූර්විකාවට ඇතුළත් කරන්න. එක්සත් රාජධානියේ ආචාර ධර්ම පද්ධතියෙහි ඇතුළත් එවැනි ඡේදයකින් මෙසේ කියැවෙයි: 'පැමිණිලි විසඳීමේදී කර්තෘවරු පුවත්පත් පැමිණිලි කොමිසම සමඟ ක්ෂණිකව සහයෝගයෙන් කටයුතු කළ යුතු වෙත්, ආචාර ධර්ම කඩකර ඇති බවට තීන්දු කරනු ලබන හැම ප්‍රකාශනයක්ම ඒ තීන්දුව, නිසි ප්‍රමුඛත්වයක් හා පුවත්පත් පැමිණිලි කොමිසම ගැන සඳහනක් සහිත සිරස්තලයක්ද සහිතව සම්පූර්ණයෙන්ම පළ කළ යුත්තේය.' ඒ ආචාර ධර්මවලින් බොහෝමයක් දැනටමත් ශ්‍රී ලංකාවේ කර්තෘවරුන්ගේ සදාචාරාත්මක බැඳීම් වශයෙන් පවත්නා නමුත් එය රීතිගතව නැත්තේය.

1. ඒ. ඉංග්‍රීසි පෙළෙහි ඇතුළත් '............පුවත්පත් කලාවේ උසස්තම ජාත්‍යන්ත ප්‍රමිති පවත්වා ගන්නා අතරම' යන කොටසේ 'ජාත්‍යන්තර'යන සඳහන ඉවත් කරන්න. ජාත්‍යන්තර පුවත්පත් කලාවේ ප්‍රායෝගිකතාව කෙරෙහි යම් අවධානයක් දැක්වෙන අතරම අප අපගේම උසස් ප්‍රමිතිය පවත්වා ගන්නේ නම්, එවැනි සඳහනක් නැතිවම අපගේ අරමුණ සපුරා ගත හැකිය. කෙසේ හෝ , සිංහල පෙළෙහි ඒ සඳහන නොදැක්වෙයි.

2. ශ්‍රී ලංකාවෙහි තරමක බරපතළ ප්‍රශ්නයක්ව පවත්නා දිවිනසාගැනීම් පිළිබඳ වාර්තා කිරීම කෙරෙහි සීමාවක් පනවන වගන්තියක් ඇතුළත් කරන්න. එක්සත් රාජධානියේ ආචාර ධර්ම

පද්ධතිය මෙසේ කියැවෙන පරිදි මෑතදී සංශෝධනය කැරුණු බව උදාහරණයක් වශයෙන් සඳහන් කරමු: ' දිවිනසා ගැනීමක් වාර්ත කිරීමේදී ඒ ජීවිත විනාශය සඳහා යොදා ගැනුණු උපක්‍රමය පිළිබඳ කරුණු පමණ ඉක්මවා ඉදිරිපත් නොකිරීමට පුවත්පත් කලාවේදියා පරෙස්සම් විය යුතුය"

3. පරිගණක ප්‍රකාශන මෙන්ම මුද්‍රිත ප්‍රකාශනවලටත් ප්‍රකාශනවල පරිවර්තන හා අනුකරණ කෙරෙහිත් මෙම ආචාර ධර්ම පද්ධතිය සදාචාරාත්මක වශයෙන් වැඩිපුර බලපාන බව පැහැදිලි කරන්න.

4. විශේෂයෙන්ම දේශීය භාෂාවලින් පළවන පුවත්පත්හි චිත්‍රක වාර්තාකරණය හා පින්තූර පාලනය කළ හැකි වන ආචාර ධර්ම පද්ධතිය විස්තාරණය විය යුතුයැයි යෝජනා ඉදිරිපත් වී තිබේ. එසේ වුවද එය දුෂ්කර කාර්යයක් වන අතරම, නිසි සංවේදිතාවෙන් හා ස්ථානෝචිත ප්‍රඥාවෙන්ද යුක්තව පොදු ජන සුබ සිද්ධිය පිළිබඳ සිය වගකීමට යටත්ව තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පුවත්පත්වලට පැවැරෙන බැඳීම ප්‍රකාශ කරන වර්තමාන 6.1 වගන්තියෙන් ආවරණය වන්නක් බවද පෙනේ.

5. දෙමළ ත්‍රස්තවාදී කණ්ඩායම්වල ප්‍රචණ්ඩ ක්‍රියා වැඩිවෙද්දී පුවත්පත් මඟින් දෙමළ ජනතාව හෙළා දකින අවස්ථාද වැඩි විණැයි සිතන්නට හේතු ඇතැයි දෙමළ පුවත්පත් පෙන්නා දී ඇති අතර ඒ කාරණය සැලැකිල්ලටද භාජන වී තිබේ. කෙසේ වුවද " දැන දැනම හෝ හිතාමතා හෝ ජනවාර්ගික හෝ ආගමික භේද හා ප්‍රචණ්ඩතාවලට අනුබල දීම තහනම් කරන 6.3 වගන්තියෙන් ඒ කාරණයද ආවරණය වන බව පෙනේ. එමෙන්ම නමින් දැක්වෙන පුද්ගලයන්ගේ ජාතිය හෝ ආගම අවමානාත්මකව හෝ අදාළ නොවන සේ සඳහන් කිරීම 6.4i හා 6.4 ii වගන්තිවලින් තහනම් වෙයි ආචාර ධර්ම පද්ධතිය සියලුම ජන වර්ගවලට එක සේ අදාළ වන හෙයින් එය වරණාත්මකව යොදා ගත හැකි නොවේ. එහි වෙනසක් සිදු කිරීමේදී ඒ කාරණය සැලකිල්ලට ගත යුතුය.

6. ආචාර ධර්ම පද්ධතියේ දීර්ඝත්වය පිළිබඳ ප්‍රශ්නද සැලැකිල්ලට භාජන වීම යෝග්‍යය. එය දිග වැඩියැයි කියන ඇතැම් විවේචකයෝ ජාත්‍යන්තර පුවත්පත් කලාවේදී සංවිධානයේ ආචාර ධර්ම පද්ධතියේ ලුහුඩු පොදු මූලධර්ම කෙරෙහි වැඩි කැමැත්තක් දක්වති. ආචාර ධර්ම පද්ධතිය වඩාත් විස්තරාත්මක වනු පිණිස එය විස්තාරණ කළ යුතුයැයි අනෙක් අය කියති. එයින් එය වඩාත් දීර්ඝ වනු ඇත. ජාත්‍යන්තර පුවත්පත් කලාවේදී සංවිධානයේ ලේඛනය, බලපෑමෙන් පුළුල්, ප්‍රායෝගික කරුණුවලට වඩා න්‍යාය පදනම් කොට ගත් අධිකරණ විනිශ්චයකට භාජන නොකළ හැකි ආචාර ධර්ම පද්ධතියකි. වර්තමාන කර්තෘ සංසද ආචාර ර්ම පද්ධතිය, ශ්‍රී ලංකාවේ තත්ත්වයට ගැළපෙන ලෙසත් අධිකරණ විනිශ්චයට භාජන විය හැකි අන්දමිනුත් සම්පාදනය වී ඇති අතර එය, සමාන වෙනත් බොහෝ ලේඛනවලට වඩා ලුහුඩුය. වඩාත් විස්තීර්ණ වුව හොත් එය කියවන පිරිස අඩුවීමත් කියවනු ලබන ප්‍රමාණය අඩුවීමත් නොවැළැක්විය හැකිය. එයින් එය පසුගාමී වනු ඇත.

. කෙසේ වුවද, නිතර අසනු ලබන ප්‍රශ්නවලට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම කලින් දී ඇති තීන්දු හා උපදෙස් අනුව ලත් අත්දැකීම් මත පිළිතුරු සපයන අතිරේක පත්‍රිකාවක් හෝ පොත් පිංචක් ප්‍රකාශයට පත්කිරීම විකල්පයක් සේ සැලකිය හැකිය. එවැනි පොත් පිංචක් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සමඟ ඒකාබද්ධ ප්‍රකාශනයක් වීම අවශ්‍ය වන අතර, නිතර පිළිතුරු සපයන ලද අනෙක් ප්‍රශ්න කෙරෙහිද එයින් අවධානය යොමු වීම අවශ්‍යය. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ කටයුතු සම්බන්ධයෙන් කර්තෘවරුන් හා පුවත්පත් කලාවේදීන් දැනුම්වත් කරනු පිණිස ආචාර ධර්ම කමිටුව ආචාර ධර්ම පද්ධතියේ විධිවිධාන අනුව එවැනි(නිතර අසනු ලබන ප්‍රශ්න ඇතුළත්) පත්‍රිකාවක් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ප්‍රකාශයට පත් කරනු ඇත.

ප්‍රකාශකයන් සඳහා වන ආචාර ධර්ම පද්ධතියක් සම්බන්ධයෙන් වරින් වර ඉස්මතුවන ප්‍රශ්න කෙරෙහිද ආචාර ධර්ම කමිටුවේ සැලකිල්ල යොමු වූයේය. එය පුවත්පත් සංගමයේ සැලකිල්ලට භාජන විය යුත්තක්ය යන්න කමිටුවේ මතය විය. එවැනි ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාව ප්‍රකාශකයනට දැනුම්දීමට කර්තෘ සංසදයට පුළුවන්කම ඇති අතර ප්‍රකාශකයකු හා කතුවරයකු අතර සම්බන්ධතාව අවශ්‍යයෙන්ම කාර්මික සම්බන්ධතාවක් වන හෙයින් එවැනි කාර්මික සම්බන්ධතාවක් හෝ අන්තර් පුද්ගල සම්බන්ධතාවක් ආචාර ධර්ම පද්ධතියකින් ආවරණය කළ හැකි නොවේය යන හැඟීම ප්‍රකාශ විය. එක්සත් රාජධානියේ ආචාර ධර්ම පද්ධතිය එවැනි ගිවිසුම්ගත බැඳීම්වලින් නිදහස්ව ක්‍රියාත්මක වන බව සඳහන් කරමු. එවැනි විධිවිධානයක් ඇතුළත් කැරුණ හොත්, කතුවරයා අභිබවා යන එක්තරා ස්වාධීනත්වයක් කර්තෘ මණ්ඩලය තුළ පුවත්පත් කලාවේදියකුට අතිරේක වශයෙන් ලැබිය හැකියැයි තර්කයක් ඉදිරිපත් වන්නට පිළිවන.

එවැනි තත්ත්වයක් ප්‍රවෘත්ති අංශයෙහි ව්‍යාකූලතාවකට හේතු වන්නට ඉඩ තිබේ. එහිදී කෙනකුට සීමාවක් පැනවිය හැක්කේ කොතැනද යන්න, පැන නැඟෙන ප්‍රශ්නයයි.

ප්‍රකාශකයන්ගේ හා කර්තෘවරුන්ගේ වෙන් වෙන් ගිවිසුම්වල අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් ආචාර ධර්ම පද්ධතියට එකඟතාව දක්වන ලෙස ප්‍රකාශකයන්ගෙන් ඉල්ලා සිටිය යුතුයැයි කමිටුව තරයේ අදහස් කරයි. ආචාර ධර්ම පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය දක්වන්නැයි ප්‍රකාශකයන්ගෙන් කරන ඉල්ලීමක්ද ඊට ඇතුළත් විය යුතුය. ආචාර ධර්ම පද්ධතිය අනාගතයේදී ප්‍රතිශෝධනය කළ යුත්තේ කෙසේද යන්න ගැන මහජනතාවගෙන් හා පුවත්පත් ක්ෂේත්‍රයෙන්ද අදහස් විමසමින් වඩාත් පුළුල් කමිටුවක් පත් කිරීම මැනවැයිද ආචාර ධර්ම කමිටුව නිර්දේශ කරයි. ඒ ආචාර ධර්ම කමිටුව එහි සාමාජිකයන්ගෙන් හා සාමාජිකයන් නොවන්නන්ගෙන්ද සමන්විත හා රීති පද්ධතියකින් සීමා නොවන මණ්ඩලයක් වනු ඇත.

උපාලි තෙන්නකෝන්

සිරි රණසිංහ

සිංහ රත්නතුංග

ජතිල වැල්ලබඩ

මනික් ද සිල්වා

ඒ. සිවනේසසෙල්වන්

ටී. කුරුවිට බණ්ඩාර

වී. තේවරාජ්

2008 ජනවාරි